PRAVACANA: The Journal of Bhiksu University of Sri Lanka, Vol. 14-Iss. II, Dec. 2023, 58-82.
DOI: https://doi.org/10.4038/p.v14i2.48

# වර්ෂ 1818 කන්ද උඩරට අරගලයේ මූලික සැලසුම පිළිබඳ මූලාශ්‍රයාශ්‍රිත අධ්‍යයනයක්

# [A Source Related Study on the Preliminary Plan of the Upcountry Rebellion in 1818]

**Watarakgoda Sumana**[1]

**Abstract**

Sri Lankan history is marked by two major uprisings against British colonial rule: the Uva-Wellassa Rebellion of 1818 and the Matale Rebellion of 1848, of which the former was more formidable. After annexing the Kandyan Kingdom in 1815 without resistance, the British soon faced growing discontent among the local population. By 1816, Ihagama Rathanapala Thero, a Buddhist monk, devised a plan to expel the British from the highlands, though it failed after discovery by John D'Oyly. Two years later, widespread rebellion erupted in the Wellassa region.

The uprising stemmed from several causes: violations of the Kandyan Convention, erosion of traditional governance, British administrative corruption, the prophecy of an "invisible king," and resentment over appointing Muslims to key posts.

A group of monks from Satkorala, while on pilgrimage to Kataragama, ignited the movement. Among them, Wilbawe Unnanse disrobed and assumed the royal title Sri Wickrama Sarva Siddhi, joining leaders such as Butawawe Rala and Kohukumbure Rala. The first major assault was the assassination of Hajji Marikkar, the British-appointed Muhandiram of Uva. Under leaders like Keppetipola Disawe, the revolt spread across the Kandyan provinces.

Although suppressed by November 1819, the rebellion underscored the Buddhist clergy's central role in mobilizing resistance. Their leadership linked religious authority with nationalist sentiment, marking a crucial phase in Sri Lanka's early anti-colonial struggle.

**Keywords**: Rebellion, Monks, British, Kandyan, Ihagama

1 Senior Lecturer, Social Sciences and Comparative Studies, Bhiksu University of Sri Lanka.
E-mail: watarakgodasumana@busl.ac.lk

Received: 7 September 2023, Accepted revised version: 30 October 2023.
This work is licensed under a Creative Commons Attribution-Share A like 4.0 International License.

## හැඳින්වීම

ශ්‍රී ලංකාවේ ජාතික ව්‍යාපාරයක් පැවතියේ යැයි තහවුරු කරන්නේ 1816 සිට 1848 දක්වා කාලපරාසය තුළ අරගල විසිනි. එහෙත් ඉන්දියානු නිදහස් අරගලයට සාපේක්ෂව ලංකාවේ පැවති තත්ත්වයන් විග්‍රහ කරන්නෝ කන්ද උඩරට දියත් කළ මෙම අරගල නිදහස් අරගලයක කොටස් ලෙස නොසලකති. වසර එකසිය තිස්තුනක (133) බ්‍රිතාන්‍ය ආධිපත්‍යයෙන් මිදීම සඳහා විවිධ කාලපරාසයන්හිදී අනුගමනය කළ ක්‍රමවේද විවිධාකාරය. 1815 බ්‍රිතාන්‍යයන්ට යටත් වූ දිනයේ සිට 1848 දක්වා කාලපරාසය තුළ බ්‍රිතාන්‍ය ආධිපත්‍යයෙන් මිදීම සඳහා අනුගමනය කරන ලද කටයුතු නූතන ව්‍යවහාරයට අනුව ජාතික ව්‍යාපාරය ලෙස හඳුන්වන්නේ නොමැතිව හැඳින්විය හැකි අන් සුදුසු වචනයක් නොමැත. ජාතියක ස්වාධීනත්වය, විමුක්තිය පිණිස ගෙනගිය මෙකී අරගල ශ්‍රී ලාංකේය ජාතික ව්‍යාපාරයේ දීප්තිමත් ආරම්භයේ ඓතිහාසික සටහන්ය.

1815 මාර්තු 18 වන දින ඇහැළේපොළ ඇතුළු උඩරට ප්‍රභූන් අත්සන් කොට අවසන් කරන ලද ගිවිසුමෙන් සමස්ත ශ්‍රී ලංකාවම පළමු වතාවට විදෙස් ජාතියක ආධිපත්‍යයට යටත් විය. එහෙත් මෙම නතු වීම අවි බලයට යටත් වීමක් නොව හුදු ගිවිසුම්ගත පවරා දීමක් විය. ආක්‍රමණිකයා මිත්‍රශීලීව ස්වකීය ආරාධනාවෙන්ම පැමිණ තම සිතැඟි පරිදි කන්ද උඩරට බලය තහවුරු කරගන්නා බව පාලනයට දායක බහුතරයක් පිරිසකට නොබෝ කාලයකින්ම වැටහිණ. ගිවිසුම් ප්‍රකාරව වැඩ කටයුතු සිදු නොවන බව පෙනිණි. භාෂාවෙන් හෝ චින්තනයෙන් හෝ අවම වශයෙන් හමේ පැහැයෙන් හෝ තමන්ට සමගාමී නොවන පාලක පිරිස පිළිබඳව අප්‍රසාදය ජනිත වීම ක්‍රමාණුකූලව මතුවෙමින් පැවතුණි. මෙම මතුවීම් ප්‍රබලවම දැකගත හැකි අවස්ථා දෙකක් හමු වේ. ඒ 1817-18 සහ 1848 ඇති වූ නිදහස් අරගලයන්ය. මෙම ප්‍රධාන අරගලයන්ට අමතරව උපතේදී ම බ්‍රිතාන්‍ය පාලකයන් විසින් වනසා දමන ලද අරගල කිහිපයක් පිළිබඳව ද හඳුනාගත හැකිය. එම අරගල 1816, 1820, 1823 සහ 1843 යන වසරවලදී ඇති වී තිබේ. මෙම සෑම අරගලයක ම අභිප්‍රාය වී ඇත්තේ කන්ද උඩරටින් බ්‍රිතාන්‍යයන් පලවා හැර යළිත් ශ්‍රී ලාංකික රජෙකු රාජ්‍යත්වය කරා ඔසවා තැබීමයි. එසේම මෙම සෑම අරගලයක් පසු පසම භික්ෂූන් වහන්සේලාගේ සහයෝගය සහ නායකත්වය පැවති බවට පැහැදිලි සාධක දක්නට ලැබේ. මෙහි දී එකී සාධක භාවිතයෙන් කරමින් 1818 අරගලයේ මූලික සැලසුම සකස්කරන ලද්දේ කවරෙකු විසින් ද යන වග තහවුරු කරමින් පර්යේෂණය සිදුකරනු ලැබේ.

## සාහිත්‍ය විමර්ශනය

බ්‍රිතාන්‍ය යටත්විජිත සමයේ ඉතිහාසය අධ්‍යයනය කිරීමේ දී හමුවන ප්‍රමුඛත ම මූලාශ්‍රය ලෙස විමලානන්ද තෙන්නකෝන් විසින් රචිත උඩරට මහ කැරැල්ල 2 කාණ්ඩය සහ 3 කාණ්ඩය යන කෘති හඳුන්වා දිය හැකිය (විමලානන්ද, 2006 a, විමලානන්ද, 2006 b) . බ්‍රිතාන්‍යයන් සතුව පවතින ලිපි ලේඛන රාශියක් පිළිබඳව තොරතුරු මෙම කෘති මගින් අනාවරණය කොට ඇත. 1818 වර්ෂයේ කන්ද උඩ රට සිදු වූ අරගලය පිළිබඳව ඓතිහාසික දත්ත සමුදායක් මෙම ග්‍රන්ථවලින් ඉදිරිපත් කොට ඇතත් එම තොරතුරු විශ්ලේෂණයට බඳුන් කොට නැත. ටිකිරි අභයසිංහ ඇතුළු පිරිස විසින් රචිත 'උඩරට රාජධානිය' කෘතියෙහි ද මෙම පර්යේෂණයට අදාළව කරුණු සාකච්ඡා කොට ඇතත් ඍජුව ම 1818 වර්ෂයේ අරගලය ගැන සාකච්ඡා කොට නැත. උඩරට රාජධානියේ සැකැස්ම හඳුනාගැනීමට මෙම කෘතිය බෙහෙවින් ඉවහල් වේ. පෝල් ඊ පීරිස්ගේ ත්‍රී සිංහලේ කෘතිය සහ කොල්වින් ආර් ද සිල්වාගේ බ්‍රිතාන්‍යයන් යටතේ ලංකාව යන කෘති ද්විත්වය ද මෙම පර්යේෂණයේ මූලික සැකැස්ම සඳහා අවශ්‍ය පසුබිම සකසාගැනීමට උපකාරී වන නමුත් 1818

අරගලය සම්බන්ධව ප්‍රමුඛ අවධානයක් දක්වමින් අධ්‍යයනය කොට නැත. 1818 අරගලය සහ එම සමයේ කන්ද උඩරට ක්‍රියාකාරීත්වය හඳුනාගැනීමට බෙහෙවින් උපකාරී වන කෘතියක් ලෙස ජොන් ඩොයිලිගේ දිනපොත හඳුනාගත හැකිය. මීට අමතරව 'ශ්‍රී ලාංකේය ඉතිහාසය වෙළුම - IV' කෘතියට "යටත් විජිතවාදයේ ව්‍යාප්තිය සහ ස්වදේශීය ප්‍රතික්‍රියා" මැයෙන් ලිපියක් සම්පාදන කරන මාලනී ඇඳගම 1818 අරගලය සම්බන්ධව සාකච්ඡා කොට ඇතත් එය ගැඹුරින් අධ්‍යයනය කොට නැත. මෙකී සාහිත්‍ය මූලාශ්‍රයන් කිසිවක දී 1818 අරගලයේ මූලික සැලසුම කාගේද යන්න පිළිබඳව අධ්‍යයනයට බඳුන් කොට නැති බැවින් මෙම ලිපියේ දී එකී කාරණාව සාධක සහිතව පර්යේෂණයට ලක් කෙරෙණු ඇත.

### පර්යේෂණ ගැටලුව

ශ්‍රී ලංකා නූතන ඉතිහාසය අධ්‍යයනයේ දී හමුවන ප්‍රධානතම අරගලය වන්නේ බ්‍රිතාන්‍ය ජාතිකයන්ගේ ආධිපත්‍යයට එරෙහිව 1818 දී දියත් කෙරුණු අරගලයි. එම අරගලයේ මූලික සැලසුම සකස් කරන ලද්දේ කවරෙකු විසින් ද? යන්න පරීක්ෂාවට ලක් කිරීම මෙම පර්යේෂණයේ ගැටලුවයි.

### පර්යේෂණ අරමුණ

1818 දී සිදුවූ බ්‍රිතාන්‍ය විරෝධී අරගලය පිළිබඳ පර්යේෂණ සිදු කොට තිබුණත් කිසිවෙකු විසින් එම අරගලයේ මූලක සැලසුම් සකස් කළේදැ යි පර්යේෂණයට බඳුන්කොට නැත. එබැවින් මෙම ලිපියේ දී එම ගැටලුවට පිළිතුරු සැපයීම ප්‍රධාන අරමුණ වශයෙන් සලකා තිබේ.

### පර්යේෂණ ක්‍රමවේදය

ඓතිහාසික පර්යේෂණ ක්‍රමවේදය මෙම පර්යේෂණයේ ක්‍රමවේදය ලෙස භාවිත කෙරේ.

### සාකච්ඡාව

### 1816 බ්‍රිතාන්‍ය විරෝධී ප්‍රයත්නය

බ්‍රිතාන්‍යයන්ට අනුව ඔවුන් විසින් පිහිටුවාගන්නා ලද පාලන තන්ත්‍රයට එරෙහිව සිදුකරන සෑම ක්‍රියාවලියක්ම කුමන්ත්‍රණයකි. එහෙත් ලාංකිකයන්ගේ පැත්තෙන් විමසා බලන කල එබඳු කුමන්ත්‍රණ අර්ථකථනය කිරීමට සිදුවන්නේ උපක්‍රමශීලිව අහිමි කරන ලද ස්වකීය දේශපාලන නිදහස ලබාගැනීම උදෙසා සිදු කරන ලද ජාතික අරගල ලෙසය. බ්‍රිතාන්‍ය රාජ්‍ය ලේඛනාගාරයෙහි ඇති රාජ්‍ය තාන්ත්‍රික ලිපි ලේඛන මගින් 1816 දී බ්‍රිතාන්‍ය පාලනය පෙරළා දැමීම සඳහා දරන ලද ප්‍රයත්නයක් පිළිබඳව තොරතුරු අනාවරණය කරගත හැකිව තිබේ. රොබට් බ්‍රවුන්රිග් විසින් 1816 නොවැම්බර් 05 වන දින රාජ්‍ය ලේකම්ට යවන ලද ලිපියෙන් මෙම රාජ්‍ය විරෝධී ප්‍රයත්නය පිළිබඳව ප්‍රථම වතාවට තොරතුරු අනාවරණය වේ.

1815 කන්ද උඩරට බල පෙරළිය සඳහා සක්‍රිය දායකත්වයක් සැපයූ පුද්ගලයෙකු වූ එක්නැලිගොඩ නිලමේ, ඇහැළේපොළ මහාධිකාරම් ලෙස පත්වීම් ලබා සබරගමුවට පැමිණීමෙන් අනතුරුව ඔහු යටතේ සේවය කොට තිබේ. ඇහැළේපොළ බ්‍රිතාන්‍යයන් හා සබඳතා පැවැත්වීමේ දී ඔහු වෙනුවෙන් ලිපි හුමාරු කිරීමේ නිරතව සිටි විශ්වාසවන්ත නිලමේවරයෙකු ලෙසද ශ්‍රී වික්‍රම රාජසිංහ රජු ජීවග්‍රහයෙන් අල්ලාගැනීම සඳහා කටයුතු කළ පිරිසේ ප්‍රමුඛයෙකු ලෙසද (Pieris, 2021, 158) එක්නැලිගොඩ නිලමේ හඳුනාගත හැකිය. මෙබඳු අතීතයකට හිමිකම් කියන සබරගමුව ප්‍රදේශයේ වාසය කළ මොහු හමුවීමට 1816 ජූලි 14වන දින පැමිණි නායක භික්ෂුවක් සහ සාමණේර භික්ෂුවක් ඉංග්‍රීසි ආණ්ඩුව පෙරළා දැමීමට තමන් හා එක් වන ලෙස පවසා තිබේ. එසේම කොළඹදී උන්වහන්සේලා හමුවිය හැකි ස්ථාන පිළිබඳවද දැනුවත් කිරීමක් සිදු කොට තිබේ. මෙම තොරතුරු දැනගත් එක්නැලිගොඩ ඊට පසු රත්නපුරය භාර යුධ

නිලධාරියා වූ කර්නල් හාඩි වෙත ඒ බව දන්වා යවා තිබේ. කුමන්ත්‍රණය පිළිබඳව දැනගත් වහාම භීතියට පත් හාඩි එය රොබට් බ්‍රවුන්රිග්ට දන්වා යැවීය (විමලානන්ද, 2006, 02). එක්නැලිගොඩ හමු වූ භික්ෂූන් පිළිබඳව තොරතුරු බ්‍රවුන්රිග් විසින් කන්ද උඩරට ප්‍රධාන නියෝජිතයා වූ ජෝන් ඩොයිලිට දන්වා යැවීමෙන් අනතුරුව මල්වතු විහාරයේදී කුමන්ත්‍රණයට සැක පිට භික්ෂූන් වහන්සේලා තුන් නමක් අත්අඩංගුවට ගන්නා ලදි. සැකකරුවන් ගැන නඩු විභාග කිරීම කන්ද උඩරටදී සිදු කළ හොත් කිසියම් කැළඹීමක් ඇති විය හැකියැ යි කල්පනා කළ ජෝන් ඩොයිලි, සැකකරුවන් ආරක්ෂක භටයන් යටතේ කොළඹට එවීය. එසේ පැමිණෙන අතර තුර අට්ටාපිටිය ප්‍රදේශයේ රැයක් ගත කිරීමට සිදු විය. එහිදී ආරක්ෂක භටයන්ගේ ප්‍රමාදයක් දුටු භික්ෂූහු අත් අඩංගුවෙන් මිදී පළා ගියහ. එහෙත් ඔවුන්ගෙන් දෙදෙනෙක් යළිත් අල්ලාගැනීමට හේවායෝ සමත් වූහ. එසේ අල්ලාගන්නා ලද එක් අයෙකුගේ නම පොද්දල්ගොඩ උන්නාන්සේ නම් වූ අතර අනෙක් තැනැත්තා කපුලියද්දේ නමින් හැඳින් වූ අතර ඔහු ඒ වන විට උපැවිදිව සිටියේය (විමලානන්ද, 2006, 33).

උඩරට අල්ලාගැනීමේ කුමන්ත්‍රණය සම්බන්ධයෙන් කොළඹදී පැවති විමර්ශනයේදී සාක්ෂ්‍ය ලබා දුන් කපුලියද්දේ තමන් සම්බන්ධව සිටි කාර්යය පිළිබඳ සියලු තෙරතුරු හෙළි කළේය. කපුලියද්දේ පුංචිරාළ වන තමා ඉහගම රතනපාල හා දොඹගොල්ල යන තෙරුන්වහන්සේලා සමග කොළඹට පැමිණි බවත් එසේ පැමිණියේ බුරුමයෙන් රාජ කුමාරයෙකු ලබාගැනීමට බුරුමයට යාමට අවශ්‍ය කටයුතු නිර්මාණය කරගැනීම සඳහා බවත් දැන්වීය. කොළඹදී එම අදහස සම්පූර්ණ නොවූ නිසා යළි මහනුවරට ගොස් අනුරාධපුරය හරහා මන්නාරමට ගොස් බුරුමයට යාම සඳහා නැවක් ලබාගත හැකිදැයි සොයා බැලූ බව කීවේය. එහෙත් එම උත්සාහයත් අසාර්ථක වීමෙන් පසුව යළිත් නුවරට පැමිණ ඉහගම හිමියන්ගේ උපදෙස් පරිදි කොළඹට පැමිණ මැලේ මුහන්දිරම් සමග සාකච්ඡා පැවැත්වූ බව අනාවරණය කළේය. මෙම මැලේ මුහන්දිරම්වරයා, 1811 දී පිළිමතලාවේ මහාධිකාරම් විසින් ශ්‍රී වික්‍රම රාජසිංහ රජු බලයෙන් පහකිරීම සඳහා දියත් කළ කුමන්ත්‍රණයේ රජු ඝාතනය කිරීමේ කාර්යය භාරව සිටි පුද්ගලයාය. එය අසාර්ථක වීමෙන් පසු පහතරට ප්‍රදේශයට පළා ගිය මොහු ඉංග්‍රීසීන්ගේ රැකවරණය යටතේ වාසය කළ අතර 1815 කන්ද උඩ රට ආක්‍රමණය අවස්ථාවේ බ්‍රිතාන්‍යයන් හා සක්‍රීයව එයට දායක විය (විමලානන්ද, 2006, 04). කන්ද උඩරට රාජ්‍ය සේවයේ නිරත වීමත් බ්‍රිතාන්‍යයන් යටතේ වාසය කිරීමත් නිසා රටේ දේශපාලන තත්ත්වය පිළිබඳව පුළුල් අවබෝධයකින් සිටි පුද්ගලයෙක් ලෙස මෙම පුද්ගලයා හඳුනාගත හැකිය. බ්‍රිතාන්‍ය රජය පෙරළා දැමීම සම්බන්ධයෙන් මැලේ මුහන්දිරම් සමග සාකච්ඡා කළ තොරතුරු ඉහගම හිමියන්ට දැන්වීමෙන් අනතුරුව එම හිමියන්ගේ උපදෙස් පිට බ්‍රිතාන්‍ය විරෝධී සටනේ මූලිකයෙකු වන මඩුගල්ලේ උඩ ගබඩා නිලමේට දැන්වීම සඳහා නුවරට ගොස් ව්‍යංගාර්ථ බසකින් තොරතුරු සන්නිවේදනය කළ බව කපුලියද්දේ ස්වකීය සාක්ෂ්‍ය ලබාදීමේ දී කියා සිටියේය (විමලානන්ද, 2006, 34).

මෙම සාක්ෂ්‍ය ලබාදීමට එක්නැලිගොඩ නිලමේ ලබාදුන් සාක්ෂ්‍ය එකතු කළ විට 1816 වසරේ සිදු කිරීමට සංවිධානය කරන ලද බ්‍රිතාන්‍ය විරෝධී අරගලයේ සැලැස්ම හඳුනාගත හැකිය. ඔහුගේ සාක්ෂ්‍ය දීමෙහි අන්තර්ගත තොරතුරු මෙසේය. 1816 ජුලි 14වන දින කිසිම පන්සලකට අයත් නැති අවුරුදු තිහක් නොවූ භික්ෂුවක් ආවතේව කරන සාමණේර නමක් සමග පැමිණ බ්‍රිතාන්‍ය විරෝධී අරගලයකට අවශ්‍ය කටයුතු සම්පාදනය වෙමින් පවතින බැවින් ඒ සඳහා සම්බන්ධ වන ලෙස ඉල්ලා තිබේ. විශාල රදළ නායකයන් පිරිසක් සමග මේ වන විටත් සාකච්ඡා පවත්වා ඔවුන්ගේ කැමැත්ත ලබාගෙන ඇති බව එම භික්ෂුව

විසින් ප්‍රකාශ කොට ඇත (විමලානන්ද, 2006, 21-22). අරගලයේ ප්‍රධාන සාධකය වන රජු පිළිබඳ ගැටලුවට ඉදිරිපත් කොට ඇති පිළිතුර වන්නේ මැලේ මුහන්දිරම් මාර්ගයෙන් ඒ වන විට කොළඹ සිරගත කොට සිටි රාජාධිරාජසිංහ රජුගේ මස්සිනා කෙනෙකු වන මුතුවාල් සාමි සහ ඔහුගේ සොහොයුරා නිදහස් කරගෙන ඉන් පසු එක් අයෙකු රජු ලෙස පත් කරගත හැකිය යන පිළිතුරයි. එසේම බ්‍රිතාන්‍යයන්ට එරෙහිව සටන් කිරීම සඳහා සේනා බලය ශක්තිමත් කිරීමට උඩරට සේවයේ යෙදී සිටින සලාගම කුලයේ දෙදහසක් පමණ කුලීකරුවන්ගේ සහයෝගය ලබාගැනීමට ඔවුන් පාලනය කරන කංකානිවරුන්ට සහ ආරච්චිවරුන්ට පුස්කොළ ලිපි යැවීමට බලාපොරොත්තු වන බව ද ප්‍රකාශ කොට තිබේ.

මෙම තොරතුරුවලින් 1816 මැද භාගය වන විට බ්‍රිතාන්‍යයන් කන්ද උඩරටින් පලවා හැරීමේ නිශ්චිත සැලැසමක් පැවති බව තහවුරු වෙයි. එම සැලැස්මේ ප්‍රධානියා ලෙස හඳුනාගත හැක්කේ ඉහගම රතනපාල නම් භික්ෂූන් වහන්සේය. පොද්දල්ගොඩ උන්නාන්සේ සහ කපුලියද්දේ උන්නාන්සේ යන අය ඉහගම හිමියන්ගේ උපදෙස් මත කටයුතු කොට තිබේ. කපුලියද්දේගේ සාක්ෂ්‍යවලට අනුව දොඹගොල්ල උන්නාන්සේ නම් භික්ෂුවක ද මේ සඳහා සම්බන්ධ වී තිබේ. මොවුන්ගේ පළමු උත්සාහය වී ඇත්තේ අලුත් රජකෙනෙකු සොයාගැනීමයි. ඒ සඳහා ඔවුන් මුලින් කටයුතු කොට ඇත්තේ බුරුමයෙන් රජ කුමරෙකු ගෙන්වා ගැනීමේ අදහසිනි. ඉහගම හිමියන් ඇතුළු පිරිස කොළඹට පැමිණෙන්නේ බ්‍රිතාන්‍ය අනුග්‍රහය යටතේ බුරුමයට යාමට අවස්ථාවක් පිළියෙල කරගැනීමට බව කපුලියද්දේගේ සාක්ෂ්‍යවලින් පැහැදිලිව අන්තර්ගත වී තිබේ. එම උත්සාහය අසාර්ථක වූ විට මන්නාරම් වරායෙන් බුරුමයට යාම සඳහා නැවක් සොයාගැනීමට කපුලියද්දේම ගියත් එයද අසාර්ථක වී තිබේ. මෙලෙස විදේශයෙන් රාජ කුමාරයෙකු ගෙන්වා ලංකාවේ රජකම ලබාදීම හිතලුවක් ලෙස පෙනුණත් එකී උපක්‍රමය පූර්ව ආදර්ශ මත සැකසුණක් බව ප්‍රකාශ කළ හැකි වන්නේ කීර්ති ශ්‍රී රාජසිංහ පාලනය පැවති සමයේ භික්ෂු වෙසින් පැමිණි සියම් රාජ කුමාරයෙකුට රජකම ලබාදීමේ කුමන්ත්‍රණයක් දියත්ව තිබූ බැවිනි (හෝල්ට්, 2002, 37-38). ලංකා-බුරුම සබඳතාව සම්බන්ධයෙන් ආණ්ඩුකාර රොබට් බ්‍රවුන්රිග්ද අවධානය යොමු කොට ඇත. මෙම කාලයේම බුරුම වැසියෙකු එක්තරා භික්ෂු පිරිසක් සමග ලංකාවේ දිගු කලක් වාසය කොට පිටත්ව ගොස් ඇති බවත් බුරුම භික්ෂූන් හත් දෙනෙකුට නොඅඩු පිරිසක් නොදන්වා සෙංකඩගල නුවරට පැමිණ ඇති බවත් තමන්ට වාර්තා වී ඇති නිසා තම අවසරයකින් තොරව එබඳු සබඳතා පැවැත්වීමට ඉඩ නොදෙන ලෙස ජෝන් ඩොයිලිව දැනුවත් කොට තිබේ (විමලානන්ද, 2006, 04). ඊට අමතරව ආවා පුරයේ රාජ සභාව හා ලංකාවේ භික්ෂූන් අතර ඇති නොසන්සුන් වූත් අහිතකර වූත් සබඳතාව ඉන්දීය මහ ආණ්ඩුවේ නියෝජිතයන් මාර්ග යෙන් නවතන ලෙස ඉල්ලා සිටීමට තමන් අදහස් කරන බව ද බ්‍රවුන්රිග් එංගලන්තයට ලියා යවා තිබේ. මේ අනුව පැහැදිලි වන්නේ ලංකාවේ සිහසුනට බුරුම කුමාරයෙකු ගෙන්වා ගත හැකි පසුබිමක් නිර්මාණය වී පැවති බවයි.

අරගලයක මූලිකම කාරණාවක් වන රජෙකු නිර්මාණය කරගැනීමේ මීළඟ ප්‍රයාසය ලෙස ඉහගම හිමියන් ඇතුළු පිරිස අනුගමනය කොට ඇත්තේ කන්ද උඩරට රජ පරපුරට නෑකම් කියන, කොළඹ සිරකොට සිටි කුමාරවරුන් දෙදෙනා නිදහස් කොටගෙන ඉන් එක් අයෙකු රාජ්‍යත්වය කරා ඔසවා තැබීමේ සැලසුමයි. අරගලය සඳහා එක්නැලිගොඩ නිලමේ එකතු කරගැනීම පිණිස සිදු කළ සාකච්ඡාවේදී ඉහගම හිමියන් මේ බව අනාවරණය කොට තිබේ (විමලානන්ද, 2006, 21-22). මේ සඳහා සහයෝගය ලබා දීමේ ප්‍රමඛයා වූ මැලේ මුහන්දිරම් පවත්වන ලද පරීක්ෂණවලින්

වැරදිකරු බවට පත්කොට බතාවියාවට පිටුවහල් කිරීමට තීරණය කෙරුණි. ඔහු මෙම පාලන පෙරළිය සඳහා සෘජුවම දායක වී ඇති පුද්ගලයෙකි; මඩුගල්ලේ උඩ ගබඩා නිළමේ. මොහු පිළිබඳව තොරතුරු අනාවරණය වන්නේද කපුවත්තේගේ සාක්ෂ්‍යවලිනි. ඉහගම හිමියන්ගේ සැලසුම්වල ක්‍රියාකාරී සාමාජිකයෙකු වූ මොහු ඉංග්‍රීසි ආණ්ඩුව විනාශ වී යේවා යි ප්‍රාර්ථනා කරමින් කතරගම සහ බින්තැන්නේ දේවාලවල වස් කවි කීමට පොල්වත්තේ උන්නාන්සේ නම් භික්ෂුවක යොදවා තිබේ. ඊට අමතරව දන්ත ධාතුව මහනුවරින් ඉවත් කර වෙනත් ස්ථානයකට ගෙනයන ලෙස මහා නායක හිමියන්ට රහසින් උපදෙස් ලබාදී තිබේ. දේවාලවල වස් කවි කීමත් දළදාව ඉංග්‍රීසි භාරයෙන් ඈත් කිරීමත් යන කාරණා මහජනයාගේ විශ්වාසය දිනා ගැනීමේ උපක්‍රමයන් ලෙස යොදාගෙන තිබේ. දෙවියන් පිළිබඳ විශ්වාසත්, දළදාවට පැවති රාජ්‍යත්වයේ අයිතිය පිළිබඳ විශ්වාසයත් සටනකදී තීරණාත්මක බලපෑම් ඇති කරන සාධක බව මතු සාකච්ඡා කෙරෙන 1818 අරගලයේ දී ප්‍රායෝගිකවම දැකගත හැකි වේ. එම නිසා මඩුගල්ලේ නිලමේගේ ක්‍රියාකාරකම් අරගලයක මුලපිරීම සඳහා මූලික මෙන්ම අත්‍යවශ්‍ය කාරණා ලෙස හඳුනාගත හැකිය. මඩුගල්ලේ සිදු කළ වැරදි සඳහා ලබාදිය යුත්තේ කුමන ආකාරයේ දඬුවමක්දැ යි ඩොයිලි විසින් උඩරට නිලමේවරුන්ගේන් සැදි සභාවක් විමසීමේ දී ඔවුන් ලබා දුන් පිළිතුර වූයේ රජකාලයේ නම් මරණීය දණ්ඩනය ලබාදෙන බවයි. එයින්ම මඩුගල්ලේගේ ක්‍රියාවන්ගේ බරපතලකම හඳුනාගත හැකිය. කෙසේ වෙතත් මඩුගල්ලේ සම්බන්ධයෙන් ජෝන් ඩොයිලි විසින් සිදුකරන ලද පරීක්ෂණවලදී ඔහු බ්‍රිතාන්‍ය පාලන බලය පෙරළා දැමීමට සම්බන්ධ බව තහවුරු විය. ඒ අනුව මඩුගල්ලේට වසර දෙකක සිර දඬුවමක් නියම විය (විමලානන්ද, 2006, 04).

මෙම පරීක්ෂණයේදී අනාවරණය වූ තවත් කාරණයක් වන්නේ මහානායක හිමියන් මඩුගල්ලේට විපක්ෂව සාක්ෂ්‍ය ලබාදී තිබීමයි. මල්වතු මහා විහාරයේ සිටියදී අත් අඩංගුවට ගත් ඉහගම හිමියන්ගේ ප්‍රධානත්වයෙන් බ්‍රිතාන්‍යයන් මෙරටින් පලවා හැරීම සඳහා අවශ්‍ය විධිවිධාන සකසමින් රටපුරා සැරිසරද්දී මහානායක හිමියන් මෙසේ මඩුගල්ලේ ගැන සාක්ෂ්‍ය ලබා දීමෙන් පෙනීයන්නේ එක්කෝ මහානායක හිමියන් මෙබඳු අරගලයක් පිළිබඳ නොදැන සිටි බවයි නැතහොත් එබඳු ක්‍රියාවකට කැමති නොවූ බවයි. එසේත් නොමැතිනම් මහනායක හිමියන් හා ඉංග්‍රීසි පාලකයන් අතර තිබූ සමීප සහසම්බන්ධතාවයි. ඉහගම හිමියන් එක්නැලිගොඩ හා සාකච්ඡාවේදී අරගලය සඳහා සහයෝගය ලබා දීමට නිලමේවරුන් විශාල ප්‍රමාණයක් එකඟ වූ බව ප්‍රකාශ කළත් ඩොයිලිගේ පරීක්ෂණවලදි මඩුගල්ලේ හැර අන් කිසිදු නිලමේවරයෙකු සහය ලබාදුන් බව තහවුරු කිරීමට සාධක නොවීය. එහෙත් 1816 නොවැම්බර් 05වන දින රොබට් බ්‍රවුන්රිග් බ්‍රිතාන්‍යයට යැවූ ලිපියේ දැක්වෙනනේ උඩරට නිලමේවරුන් පිළිබඳව තමාට ඇත්තේ සැකයක්ම බවයි (විමලානන්ද, 2006, 12).

කෙසේ වෙතත් ඉහගම රතනපාල නම් තෙරනමකගේ ප්‍රමුඛත්වයෙන් සංවිධානය වූ උක්ත අරගලය ඉංග්‍රීසීන්ට එරෙහිව ගොඩනගන ලද ප්‍රථම නිදහස් අරගලය ලෙස හඳුනාගත හැකිය. ඉතිහාස රචනයේ මෙම අරගලයට එතරම් වටිනාකමක් හිමිව නොමැති වුවත් බ්‍රිතාන්‍යයන් ලංකාවෙන් පලවා හැරීමේ පරමාර්ථයෙන් ක්‍රමානුකූලව ක්‍රියාත්මක කිරීම සඳහා සැලසුම් කරන ලද අරගලයක් බව බ්‍රිතාන්‍ය ලේඛනවලින්ම මැනවින් තහවුරු වේ. මේ ගැන අදහස් දැක්වූ බ්‍රවුන්රිග් ප්‍රකාශ කළේ මෙවැනි හිස් විහිලුවක් මහජනයාගේ විශ්වාසයට පාත්‍ර වන පරිදි ඇත්තක් ලෙස පෙන්වීමට ඉඩ ලැබෙන පරිද්දෙන් නිලමේවරුන් පවා අන්ධ භක්තියේ ලා තබාගැනීමට ඔවුන්ගේ ආගමේ පූජ්‍යවරුන්ට පුළුවනි යනාදී වශයෙනි. මූලික වශයෙන් මෙම කුමන්ත්‍රණයට එක්වූවන්

ලෙස හඳුනාගන්නේ භික්ෂූන් වහන්සේලා හතර නමක් හා එක් නිලමේ කෙනෙක් පමණක් නිසා ප්‍රබල බ්‍රිතාන්‍යයන්ට විහිලුවක් ලෙස පෙනුනත් භික්ෂූන්ගේ මැදිහත් වීම, විහිලුව සත්‍යක් බවට පරිවර්තනය කරන සාධකය ලෙස හඳුනාගෙන තිබේ. ඒ බව ඍජුවම ප්‍රකාශ කරන ආණ්ඩුකාරවරයා "මට පෙනෙන විදිහට මේ කුමන්ත්‍රණවල නායකයෝ නම් භික්ෂූහුමය නිලමේවරුන් මොවුන්ට අවනත හෙයින් රටේ ඇතිවන අප්‍රසාදයක් හෝ විරුද්ධතාවක් ආයුධ කරගෙන කවර විටකදී වුව ද පිරිසක් එකතුකර සංවිධානය කරන්නට මොවුන්ට පුළුවන. මොවුන් රැස්වනුයේ රහසිගතවය. මොවුන්ගේ චරපුරුෂයෝ බොහෝ වෙති. මොවුනගේ වරප්‍රසාද අප්‍රමාණය, බොරු වෙස් දරා කපටිකම් කිරීමේ පුරුද්ද හා පුහුණුව ඇති මොවුන්ගේ සැබෑ අදහස් මතුකරගැනීම අමාරුය" (විමලානන්ද, 2006 a, 1-7). යනුවෙන් බ්‍රිතාන්‍ය රාජ්‍ය ලේකම් බැතර්ස්ට් වංශාධිපතිවරයාට ලියා යැවීය.

රොබට් බ්‍රවුන්රිග් විසින් විශේෂ වරප්‍රසාද ලබාදෙමින් හා විශේෂ හිතෛශීවන්ත භාවයක් පෙන්වමින් භික්ෂූන් වහන්සේලා දිනාගැනීමට කටයුතු කළත් එය සම්පූර්ණයෙන්ම සාර්ථක නොවූ බව බ්‍රිතාන්‍යයන් උඩරටින් එළවා දැමීමට භික්ෂූන්ම ප්‍රමුඛත්වය ගෙන සැලසුම් සැකසීමෙන් පැහැදිලි වේ. එසේ වුවත් භික්ෂූන් සම්බන්ධයෙන් තීන්දු තීරණ ගැනීමේ දී බ්‍රිතාන්‍යයන් කල්පනාකාරීව කටයුතු කොට තිබේ. මෙම කුමන්ත්‍රණය පිළිබඳව මුලින්ම මල්වත්තේදී අත් අඩංගුවට ගත් භික්ෂූන් සම්බන්ධ නඩු විභාගය සඳහා කොළඹට එවීම මෙන්ම මඩුගල්ලේ නිලමේගේ මෙහෙයවීම මත බ්‍රිතාන්‍යන්ට එරෙහිව වස් කවි කියූ පොල්වත්තේ හිමියන්ට දඬුවම් දියයුත්තේ කෙසේදැ යි මහා නායක හිමියන් විමසීම එබඳු අවස්ථාය (විමලානන්ද, 2006 a, 59-60). අත් අඩංගුවට ගන්නා විටත් උපැවිදිව සිටි කපුවත්තේ බ්‍රිතාන්‍යයන් යටතේම කොළඹ වාසය සඳහා අවසර ඉල්ලාගෙන ක්‍රිස්තියානි ආගමද වැලඳගෙන බ්‍රිතාන්‍ය අනුගාමිකයෙකු බවට පත් වූ අතර මහානායක හිමියන්ගේ උපදෙස් පරිදි පොල්වත්තේ උන්නාන්සේ උපැවිදි භාවයට පත් කොට එක් පන්සලක නැවතී සිටිය හැකි කාලයද සීමා කොට තිබේ. මෙම සමස්ත ක්‍රියාවලියේ සැලසුම්කරුවා ලෙස හඳුනාගත හැකි ඉහගම උන්වහන්සේ නැවත අත් අඩංගුවට ගැනීමට බ්‍රිතාන්‍යයන් අසමත් වන අතර යළිත් වරක් උන්නාන්සේ 1818 නිදහස් අරගලයේදී මතුවන ආකාරය හඳුනාගත හැකිය.

මේ ආකාරයට 1815 මාර්තු මාසයේදී බ්‍රිතාන්‍යයන්ට යටත් වීමෙන් අනතුරුව වසරකුත් මාස කීපයක් ගෙවීයන අවස්ථාවේ ලංකාවේ ඇති වූ ප්‍රථම නිදහස් අරගලය ලෙස මෙය සාකච්ඡාවට බඳුන් කළ හැකිය. එහි විශේෂම ලක්ෂණයන් වන්නේ භික්ෂූන් වහන්සේලාගේ සක්‍රීය මැදිහත් වීම පැහැදිලිව හඳුනාගත හැකිවීමත් බ්‍රිතාන්‍ය ආණ්ඩුකාරවරයා එය පිළිගෙන තිබීමත්ය. 1818දී ක්‍රියාවට නැගෙන නිදහස් අරගලයේ පූර්ව අත්හදාබැලීම ලෙසද 1816 ආරම්භයේදීම බ්‍රිතාන්‍යයන් විසින් යටපත් කොට දමන ලද මෙම අරගලය හඳුනාගත හැකිය.

### 1818 අරගලය බිහිවීමට හේතු

බ්‍රිතාන්‍යන් විසින් බුදු දහමට නොසැලකීම සහ කන්ද උඩරට පැවති සාම්ප්‍රදායික සමාජ ක්‍රමය වෙනස්වීමට එරෙහිව සැලසුම් කරන ලද අක්‍රීය අරලගලයක් ලෙස 1816 ඇතිවූ පූර්වෝක්ත සිදුවීම හැඳින්විය හැකිය. එම සිදුවීමෙන් පෙනෙන්නේ බ්‍රිතාන්‍ය පාලන විරෝධී අදහස් කිහිපදෙනෙකු තුළ තිබුණු අතර අනාගතයේ ස්වකීය ස්වාධීනතාව ප්‍රබල අභියෝගයකට මුහුණ දෙන බව වටහාගත් පිරිස ඉතා අල්ප වූ බවයි. එහෙත් 1817 පමණ වන විට බ්‍රිතාන්‍ය විරෝධී ආකල්ප බහුල වන අකාරය හඳුනාගත හැකිය. එසේ බ්‍රිතාන්‍ය විරෝධී ආකල්ප ප්‍රබල වී උඩරට 1818දී නිදහස් අරගලයක් ඇතිවීමට හේතු වූ කාරණා ප්‍රධාන තේමා කීපයක් යටතේ විග්‍රහ කළ හැකිය. බලාපොරොත්තු වූ අභිමතාර්ථ

සඵල නොවීම, උඩරට ගිවිසුමේ වගන්ති උල්ලංඝනය කිරීම, සාම්ප්‍රදායික ජීවන ක්‍රමය වෙනස් වීම, නොපෙනෙන රජෙකු විශ්වාස කරන්නට වීම, මුස්ලිම් ජාතිකයන්ට තනතුරු ප්‍රදානය කිරීම යනාදිය එම තේමා ය.

ශ්‍රී වික්‍රම රාජසිංහ රජු සිංහාසනයෙන් නෙරපූ පසු බ්‍රිතාන්‍යයන් ආපසු කොළඹ කරා නොයාම සම්බන්ධයෙන් උඩරට වැසියන් අතර මහත් විශ්මයක් පැවති බවත් බ්‍රිතාන්‍යයන්ගේ ඒ ගමන කවදා සිදුවේදැයි ඔවුන් නිතර ප්‍රශ්න කරමින් සිටි බවත් සමකාලීන ඉතිහාස ග්‍රන්ථයන්හි සඳහන් වේ (මාර්ෂල්ගේ ඉතිහාසය, 175). මතුරට දිසාපතීන්ට ඇහැලේපොළ නිලමේ විසින් යවන ලද සන්දේශයකින් බ්‍රිතාන්‍යයන් විසින් උඩරට යටත් කරගත්තත් එහි පාලනය සිංහල රජ කෙනෙකු විසින් සිදු කරන්නේය යන තහවුරුව ලබාදී තිබුණි (අලුවිහාරේ, 1941, 01). උඩරට ගිවිසුම සඳහා සැමදෙනාගේ ම කැමැත්ත ලබාගැනීමට හැකි වූයේ ලක්දිව ඔටුන්න සිංහලයෙකුට ලබාදීමේ පොරොන්දුව මතය (විමලානන්ද, 2006 a, 1815.2.25 දරණ 29 වන සන්දේශය). මෙම සහයෝගය ලබාගැනීම පිළිබඳව එමර්සන් ටෙනන්ට් මෙසේ දක්වා තිබේ. 1815 ගිවිසුම ඇතිකිරීමට ක්‍රියාරම්භ කළ කාලයේදී සිය රට පාවාදීමට භික්ෂූන් හා දිසාපතීන් මුළුමනින්ම නොකැමති වූ බවත් නෙරපන ලද වඩුග රජු වෙනුවට සිංහල රජෙකු සිංහාසනයට පත්කිරීම ඔවුන්ගේ ආගමේ ආරක්ෂාව සඳහා අත්‍යවශ්‍යකයැ යි හැඟවූ බවත් සර් රොබට් බ්‍රවුන්රිග් ඒ කාලයේම දන්වා සිටි බවයි. මීට අමතරව පූර්වයෙන් විස්තරාත්මකව පෙන්වා දෙන ලද පරිදි රජකු නොවූවත් රජකු ලෙස හැසිරුණු ඇහැලේපොළගේ ක්‍රියාකාරකම් ද පෙන්වා දෙන ලද්දේ ඉංග්‍රීසීන් විසින් පොරොන්දු කඩ කර ඇති බවයි. මෙම සියලු කාරණාවන්ගෙන් ගම්‍යමාන වන්නේ උඩරැටියන් ඉංග්‍රීසීන් යටතේ පාලනය වීමේ අපේක්ෂාවකින් පසු නොවූ බවයි. ඔවුන්ගේ අපේක්ෂාව වූයේ ශ්‍රී වික්‍රම රාජසිංහගෙන් ගැලවීම පමණි. එහෙත් අවසන සිදු වූයේ අපේක්ෂිත අභිමතාර්ථ සඵල නොවීමෙන් තම යහපතට කැඳවූ විදෙස් මිත්‍රයාට විරුද්ධ වීමේ පිළිවෙතකට ගමන් කිරීමයි.

උඩරට පළාතත් මුහුදු බඩ පළාතත් එකම ආධිපත්‍යයක් යටතට පත්ව තිබුණත් පළාත් දෙකේ ක්‍රියාත්මක කෙරුණේ පාලන විධීන් දෙකකි. මුහුදු බඩ කලාපය, සම්පූර්ණයෙන්ම ස්වකීය ඕනෑ එපාකම් අනුව සැකසුණු පාලන ක්‍රමයක් අනුව බ්‍රිතාන්‍යයන් විසින් පාලනය කෙරුණු අතර උඩරට පැවතියේ දෙමුහුන් පාලන ක්‍රමයකි. එම දෙමුහුන් පාලන ක්‍රමයේදී බ්‍රිතාන්‍යයන් සහ උඩරැටියන් එකඟතාවකට ගෙන එන ලද ලියවිල්ල උඩරට ගිවිසුමයි. මෙම ගිවිසුම මූලිකත්වයේ තබා උඩරට පළාත්වල පාලනය බ්‍රිතාන්‍ය නේවාසික, නීතිය පිළිබඳ කොමසාරිස්වර, ආදායම් පිළිබඳ කොමසාරිස්වර, යුද්ධ හමුදාවන් හට අණ දෙන නිලධර යන මොවුන්ගෙන් හා ලේකම්වරයෙකුගෙන් සමන්විත මණ්ඩලයකට පවරන ලද්දේය (පෙරේරා පියතුමා, 1967, 68). අධිකරණමය කටයුතු මෙහෙයවන ලද්දේ මෙම මණ්ඩලයත්, අධිකාරම්වරු හා ප්‍රධාන ජන අධිපතීන්ගෙන් සමන්විත මණ්ඩලයක් විසිනි. පූර්වයෙන් සාකච්ඡා කරන ලද 1816දී ඇති වූ අක්‍රීය අරගලයට සම්බන්ධ පිරිස් පිළිබඳව නඩු විමසන ලද්දේ මෙම අධිකරණ මණ්ඩලයෙනි. එසේම උඩරට පැවති සාම්ප්‍රදායික කුල ක්‍රමය ගැන සැලකිල්ලක් නොදක්වා නඩු තීන්දු ලබාදීම සම්බන්ධයෙන් ප්‍රභූ පැලැන්තිය වෙතින් ප්‍රකාශ වූයේ නොරුස්නා ස්වභාවයකි. ඒ ඒ ප්‍රදේශවල සාමාන්‍ය සිදුවීම් සම්බන්ධ නඩු විභාග කිරීම් රාජාණ්ඩුව පැවති කාලයේ මෙන්ම පළමු අධිකාරම්, දෙවන අධිකාරම්, දිසාපති හා රටේ මහත්මයා යන නිලධාරී යාන්ත්‍රණය විසින් සිදු කරන ලදි. එසේ වුවත් තුන් කෝරළය, සතර කෝරළය, ඌව සහ සබරගමු පළාත්වලට ආදයම් පාලක උප ඒජන්තවරුන් පත්කිරීම නිසා එම ප්‍රදේශ භාරව සිටි සිංහල නිලධාරීන්ගේ ආධිපත්‍යයට යම් අකාරයක බලපෑමක් එල්ල විය. එය

උඩරට ගිවිසුම සම්බන්ධ එකඟතාවන් ඉක්මවා යන තත්ත්වයක් විය.

ගිවිසුමේ පස්වන වගන්තිය අනුව බුදු දහම ආරක්ෂා කිරීමට ගිවිසුමෙන් බ්‍රිතාන්‍යයන් ප්‍රතිඥා ලබාදී තිබුණත් ක්‍රිස්තියානි දහම මුල්කරගත් ආණ්ඩුවකට එය කළ හැකිද යන ප්‍රශ්නය මුල සිටම පැවති අතර දිනෙන් දින එය වර්ධනය වන ස්වරූපයක් හඳුනාගත හැකිය. පෙර රජ දවස දන්ත ධාතුවට දැක්වූ ගරු සැලකිලි සම්මාන රජය බාර ඉංග්‍රීසි නිලධාරීන් වෙතින් සිදු නොවීය. භික්ෂූන් වහන්සේලාට දැක් වූ වන්දනා මාන කිරීම් සිදු නොකළ අතර උන්වහන්සේලා ආණ්ඩුකාරයාට ගරුකළ යුතු තත්ත්වයක් නිර්මාණය වී තිබුණි. රජුගෙන් පවා වන්දනා ලද පිරිසකට මෙබඳු වෙනස් වීම් ප්‍රබලව දැනෙන කාරණාවන් බවට පත්වීම ස්වාභාවිකවම සිදුවන්නකි. එසේම බෞද්ධ උත්සවාදියට සහභාගී වීම ආණ්ඩුකාරයාට සිදු කළ නොහැකි විය. මෙම කාරණාවන් විසින් මතු කරනු ලබනුයේ ගිවිසුමේ පස්වන වගන්තිය සෘජුවම උල්ලංඝනයකට ලක්වන බවයි.

බ්‍රිතාන්‍යයන් බුදු දහම හා භික්ෂුව සම්බන්ධයෙන් පහතරට ප්‍රදේශයන්හිදී අනුගමනය කරන ලද කාර්ය පටිපාටිය විමසීමේ දී පැහැදිලි වන්නේ උඩරටදීද ඒ හා සමාන පිළිවෙතක් අනුගමනය කොට ඇති බවයි. 1807 දී බ්‍රිතාන්‍ය අණ්ඩුකාරයාව සිටි තෝමස් මේට්ලන්ඩ් මාතර පළාත බාර ඒජන්තවරයා වූ ඊඩින් මහතාට යවන ලද ලිපියක මෙසේ සඳහන්ව තිබේ. "ඔබගේ පළාතේ භික්ෂූන් පිළිබඳව හෝ ඔවුන්ගේ ඉඩකඩම් චාරිත්‍ර විධි පිළිබඳව හෝ හටගන්නා සියලුම නඩු විසඳීම පිණිස බෞද්ධ භික්ෂූන්ගේ කොමිටියක් පත්කිරීමට මගේ අදහස තිබේ. මේ අන්දමේ කොමිටියක් පත්කිරීමේ පරමාර්ථය නම්, පළමුකොටම මිනිසුන්ගේ ආගමික විශ්වාසයන්ට හා චාරිත්‍රවලට මහත් ගෞරවයක් හා සැලකිල්ලක් දක්වන බැව් ඔවුන්ට අවබෝධ කරවීමයි. දෙවනුව, අපේ ආණ්ඩුව සහ භික්ෂූන් අතර මිත්‍රත්වයක් ඇතිකොට, ඊළගට රටවැසියන් අතර ආණ්ඩුවේ බලය තහවුරු කිරීමට භික්ෂූන් තුළ උනන්දුවක් ඇති කිරීමයි. අප විසින් කරුණු හරිහැටි වටහා නොගැනීම නිසා, මුදලිවරුන් සහ ප්‍රධාන භික්ෂූන් අතර මේතාක් පවතින්නට ඉඩහැර තිබෙන බලසම්පන්න අන්‍යෝන්‍ය සම්බන්ධය ඒ මගින් කඩා දැමීමයි. මුදලිවරුන් සහ ප්‍රධාන භික්ෂූන් අතර පවත්නා මේ සම්බන්ධය බ්‍රිතාන්‍ය අපේක්ෂාවන්ට මහත් බාධාවක් මෙන් ම මහනුවර රජුට ලොකු වාසියකි" (රාහුල හිමි, 2012, 75). පැවති දේශීය යාන්ත්‍රණයෙන් භික්ෂූන් වහන්සේලා සහ ගිහි ප්‍රභූ නායකයන් අතර පැවති සබඳතාව බිඳ දැමීමේ බ්‍රිතාන්‍ය අභිලාෂය මෙමඋද්ධෘතයෙන් මැනවින් තහවුරු වේ. මීට අමතරව මහනුවර හා සබඳතා පවත්වමින් පහතරට ප්‍රදේශයේ ජනයා අතර ආගමික ප්‍රබෝධයක් ඇති කිරීමට සමත්ව තිබූ විහාරයක් වූ මුල්ගිරිගල විහාරය සම්බන්ධයෙන් අනුගමනය කිරීමට මේට්ලන්ඩ් අණ්ඩුකාරවරයා විසින් ලබාදුන් උපදේශනයන් මගින්ද පෙන්නුම් කරන්නේ භික්ෂූන් වහන්සේලා සහ දේශීය නායකයන් අතර විශ්වාසය විනාශ වන ආකාරයටත් භික්ෂූන් වහන්සේලා අතර බ්‍රිතාන්‍ය ආධිපත්‍යය තහවුරු වන ආකාරයටත් කටයුතු කිරීම බ්‍රිතාන්‍ය ක්‍රමය වූ බවයි.

බ්‍රිතාන්‍ය ආධිපත්‍යයට යටත්ව පවතින මුහුදු බඩ කලාපයේ යම් ආකාරයකට හෝ මහනුවර රජුගේ බලය රඳා පවතින්නේ නම් ඒ ආගමික වශයෙන් පවතින සබඳතාව මත බව බ්‍රිතාන්‍යයෝ අවබෝධ කරගත්හ. පහත රට භික්ෂූන් වහන්සේලාට මහනුවරින් ලබාදෙන නායක පදවි හරහා මේ බලය ස්ථාවරව පවතින බව නිරීක්ෂණය කළ බ්‍රිතාන්‍යයන්, රජු ලබාදෙන නායකකමට වඩා බලය සහිත නායක කම් පහතරට භික්ෂූන්ට ලබා දීමට වැඩ කටයුතු සැලැස්වීය. මාතර වේරගම්පිට විහාරයේ වාසය කළ කරතොට ධර්මාරාම හිමියන්ට නායකකම් ලබා දීමට කටයුතු කිරීමෙන් ඒ බව තහවුරු වේ. මෙම

තහවුරුව බ්‍රිතාන්‍යයන් විසින්ම තහවුරු කර ඇත්තේ මේට්ලන්ඩ් ආණ්ඩුකාරයා විසින් 1806 සැප්තැම්බර් 20වන දින එංගලන්තයේ විලියම් වින්ඩ්හැම් මහතා වෙත යවන ලද ලිපියකිනි. මෙහිදී මහනුවර රජුට වඩා බලාත්මක ලෙස භික්ෂූන්ට නායකකම් ලබා දීම ස්වකීය අභිලාෂය බව මේට්ලන්ඩ් ලියා දන්වා තිබේ (රාහුල හිමි, 2012, 77).

බ්‍රිතාන්‍යයන් පහත රටේදී අනුගමනය කළ මෙම ක්‍රියාකාරකම් කන්ද උඩරට ජයග්‍රහණයෙන් පසුව එහිද අනුමනය කරන ලද ආකාරය පූර්වයෙන් පෙන්වාදී තිබේ. නායකකම් ආදිය ලබා දීමෙන් සහ ආගමික කටයුතු සඳහා අනුග්‍රහ දැක්වීමෙන්, ගිවිසුම් ප්‍රකාරවද භික්ෂූන්වහන්සේලා දිනාගැනීමෙන් ජනතාව අතර තම පාලනය තහවුරු කරගැනීමේ අරමුණින්ද කටයුතු කළ බ්‍රිතාන්‍යයන් වෙතින් කල්යත්ම එකී අවශ්‍යතා ප්‍රමුඛත්වයේ ලා නොසලකන තත්ත්වයක් වර්ධනය වන ආකාරය හඳුනාගත හැකිය. තම බලයට තර්ජනයක් එල්ල කිරීමට තවදුරටත් උඩරට භික්ෂූන් සහ ප්‍රභූන් සමත් නොවෙතැ යි යන විශ්වාසය, බ්‍රිතාන්‍යයන් තුළ එබඳු තත්ත්වයක් වර්ධනය වීමට හේතු වූ ප්‍රධාන කරුණයි. එසේ තම බලයට භික්ෂූන් සහ රදලයන් තර්ජනයක් නොවන ආකාරයට උපක්‍රමශීලීව වැඩ කටයුතු කරනලද බව 1816 නොවැම්බර් 05 රජගෙදර සිට රොබට් බ්‍රවුන්රිග් විසින් රාජ්‍ය ලේකම් බැතර්ස්ට් වංශාධිපති වෙත යැවූ ලිපියේ සඳහන් "උඩර ටියන් අසමගි කිරීමේ බලාපොරොත්තුවෙන් භික්ෂූන් වහන්සේලාට සහ රදලවරුන්ට අයුතු සේ බලවත් චෝදනා කිරීමත් ආරම්භ කරන ලදි" (අලුවිහාරේ, 1941,4) යන ප්‍රකාශයෙන් අවබෝධ කොටගත හැකිය. ස්වකීය පාලනයේ ස්ථායිතාව වෙනුවෙන් අන්‍යයන් අතර භේදභින්නතා වර්ධනය කිරීමේ ක්‍රමය පහතරටේදී භාවිත කළා සේම උඩරටදී ද භාවිත කරන ලද බව මෙයින් තවදුරටත් තහවුරු වේ. භික්ෂුව හා බැඳුණු ආගම කෙරෙහි සුවිශේෂ භක්තියක් දක්වන ජන ප්‍රජාවක් සිටින කන්ද උඩරට, බලය තහවුරු කරගැනීමට බුද්ධාගම ආරක්ෂා කිරීමට විශේෂයෙන් බැඳී සිටින බවට ප්‍රතිඥා දී තිබුණත් ක්‍රමිකව එය අමතක කිරීම, 1818 අරගලයට ප්‍රධාන හේතුවක් විය.

බ්‍රිතාන්‍ය විරෝධී අරගලයකට මූලිකත්වය සැපයූ තවත් හේතුවක් වන්නේ උඩරට ප්‍රදේශයේ පැවති සාම්ප්‍රදායික ජීවන රටාව වේගයෙන් වෙනස් වීමයි. 1815 මාර්තු මස 19වන දින ආණ්ඩුකාරයා මුණගැසුණු භික්ෂූන්වහන්සේලා, හේවායින් විසින් සිදුකරනු ලබන නීති විරෝධී කටයුතු සහ කොල්ල කෑම් ආදි අකටයුතුකම් ගැන චෝදනා කළහ (කොඩ්රිංටන්,1994,249). චෝදනාවන්ට පිළිතුරු වශයෙන් ආණ්ඩුකාරයා ප්‍රකාශ කළේ හේවායන්ගේ අක්‍රමිකතා තවදුරටත් සිදු නොවීම සඳහා තදින්ම නීති පනවන බවයි. කන්ද උඩරට අත්පත් කර ගැනීමේ දී යුද්ධයක් සිදු නොවුණු නිසා සාමාන්‍ය යටත් කරගැනීමකදී හේවායින්ට ලැබෙන වරප්‍රසාද වන කොල්ලකෑම්, ස්ත්‍රී දූෂණ ආදිය සිදු කළ නොහැකි විය. එහෙත් භික්ෂූන්ගේ චෝදනාවලින් පෙනෙන්නේ යම් ආකාරයකට එම වරප්‍රසාද ලබාගැනීම හේවායින් කටයුතු කොට ඇති බවයි. ඌවේ ඇල්ල හා බෝගොඩ විහාර, කටුගහ හා මුල්ලේගම පවුලේ වලව් මේ ඉරණමට භාජනය විය. විදේශීය සොල්දාදුවෝ සමහර විට දුප්පත් ගොවීන් සතු හරක් මරාගෙන කෑහ; බීමත්ව හැසිරුණහ (අභයසිංහ සහ තවත් අය, 1977, 129). ගම්බද ජීවන රටාව වෙනස් කරන මෙබඳු කටයුතු නිතැතින්ම විදේශීය ආණ්ඩුව කෙරෙහි මහජන අප්‍රසාදය වර්ධනය කිරීමට හේතු විය.

සාම්ප්‍රදායික උඩරට සමාජ ව්‍යුහයේ රදල ප්‍රධානීන්ට ඉහළින් සිටියේ රජු පමණි. එහෙත් අලුතින් නිර්මාණය වන සමාජ ක්‍රමයේ ඔවුන් අණ්ඩුකාරයාට, සෙසු සියලු ඉංග්‍රීසි නිලධාරීන්ට, ඉංග්‍රීසි හමුදා සොල්දාදුවන්ට පමණක් නොව ඉංග්‍රීසි ජාතික සිවිල් පුද්ගලයන්ට පවා පහළ තත්ත්වයකට පත්වී

ඇති බව පැහැදිලි විය (ඇදගම, 2014, 119). ඉතාම පහත් කුලයේ පුද්ගලයෙකුට දක්වන ගරුසැලකිල්ලට වැඩි යමක් බ්‍රිතාන්‍යයන් වෙතින් රදලයන්ට නොලැබුණි. පෙර රජ දවස අභිමානයෙන් යුක්තව රාජ සභාවේ කටයුතු සඳහා සම්බන්ධ වූ රදලයෝ, උඩරට බ්‍රිතාන්‍ය නිත්‍ය නියෝජිතයා වන ජෝන් ඩොයිලි ඉදිරියේ නාම මාත්‍රික ගරු කටයුත්තෝ පමණක් වූහ. පහතරට කරාවේ, දුරාවේ, හලාගම සහ තවත් පහත් කුලවල අය මුදලි තනතුරුවලට පත් වී උඩරට ප්‍රදේශයන්හි දෝලාවලින් ගමන් බිමන් යාම නිසාද ඉහළ කුල රදලයන්ගේ තත්ත්වය තවත් අඩුවන්නට වූයෙන් පහත් කුලවල අය උඩරට දෝලාවලින් ගමන්කිරීම තහනම් කරන ලෙස ඉල්ලා සිටීමට රදලයන්ට සිදු විය (කොඩ්රිංටන්,1994,250). මේ ආකාරයට රදලයන්ට ගෞරව දැක්වීම පරිහානියට පත්වන අතර ඔවුන්ට ආර්ථික වශයෙන්ද පරිහානියට ලක්වීමට සිදු විය. පෙර උඩරට හා පහතරට අතර වෙළඳ ද්‍රව්‍ය හුවමාරු කිරීමේ දී දේශ සීමාවන්හිදී බද්දක් අය කෙරුණි. එම බදු අයකිරීම සිදු කළේ රදලයන් විසිනි. එහෙත් රටම එක් පාලනයක් යටතට පත් වූ නිසා කඩවත් මගින් බදු අයකිරීම නවතා දැමීය. මේ හේතුවෙන් සත් කෝරළය, සතර කෝරළය, තුන් කෝරළය, ඌව, සබරගමුව සහ නුවර කලාවිය යන දිසාවන්හි කඩවත් දාහතරකින් ලද තීරු බදු සහ වෙනත් ලාභ ප්‍රයෝජන නැති වී ගියේය. මින් සෘජුවම පහර වැදුනේ රදලයන්ට නිසා ඔවුහු මහත් අසහනයකින් පසු වූහ.

මීට අමතරව පෙර රජතුමාගේ කාලයේදී බෙදාදී තිබූ අවි ආයුධ ආපසු බාරදී නොතිබූ බව ආවුධ ගෙයි ලිපි ලේඛන පරීක්ෂාවේදී ඩොයිලි අනාවරණය කරගත්තේය. ඒ අනුව වැසියන් සන්තකයේ තිබෙන සියලු තුවක්කු, කඩු, උල් සහ වෙනත් යුද්ධෝපකරණ මහනුවර කච්චේරියට හෝ ඒවා ලබාගැනීම සඳහා ආණ්ඩුවෙන් බලය පවරා දෙන ලද නිලධරයන්ට හෝ ගෙන ගොස් බාර දිය යුතු බවට නියෝග නිකුත් කළේය (පෙරේරා පියතුමා,1967, 72). මින් සිදුවූයේ ද ආයුධ බෙදා හරින්නන් ලෙස ප්‍රභූන් දැරූ අධිපත්‍යය ඔවුන්ට අහිමි වීමය. මේ ආකාරයට දෙමුහුන් පාලන තන්ත්‍රයක් තුළ විමධ්‍යගතව පැවති පාලන බලතල ක්‍රමිකව බ්‍රිතාන්‍ය අධිකාරිය යටතට මධ්‍යගත කරවන ආකාරය හඳුනාගත හැකිය. තම රාජ්‍යයේම තමන් අවලංගු වන බව රදල පැලැන්තියට අවබෝධ වීම 1818 අරගලයට මාවත විවර කරවීමක් විය.

1818 ඇති වූ නිදහස් අරගලයට ප්‍රබලවම බලපෑ ආසන්නම හේතුව ලෙස මෙම අරගලය සම්බන්ධයෙන් තොරතුරු දක්වා ඇති සෑම පර්යේෂකයෙකු ම පෙන්වා දෙන්නේ වෙල්ලස්සේ මඩිගේ මුහන්දිරම් තනතුරට මුස්ලිම්වරයෙකු පත්කිරීමයි. එහෙත් විමර්ශනශීලීව අධ්‍යයනය කරන විට පෙනීයන්නේ මුස්ලිම්වරයෙකු එම තනතුරට පත්කිරීම පසුපස සිංහල ජනතාව අරගලයක් දක්වා ගමන් කිරීමට එම සිදුවීමට පෙර සිදු වූ ක්‍රියාවලීන්ද බෙහෙවින් බලපා ඇති බවයි. බ්‍රිතාන්‍ය සහ මුස්ලිම් සබැඳියාවේ උච්චතම අවස්ථාවක ප්‍රතිඵලය වෙල්ලස්සේ දී පුපුරා ගිය ආකාරය ලෝනා දේවරාජ මැනවින් පෙන්වා දී තිබේ. උඩරට සමාජයේ සෑම ස්තරයකම බ්‍රිතාන්‍ය පාලනය සම්බන්ධව අප්‍රසන්නතා වර්ධනය වුව ද මුස්ලිම් ජනයාට එය ප්‍රීතිය වඩවන්නක් විය. පාලකයා කවරෙක් වුව ද තම වාසියට ඔහුට පක්ෂපාතීත්වය පිරිනැමීම මුස්ලිම්වරුන්ගේ ප්‍රතිපත්තිය විය. රට තොට ඇවිදිමින් වෙළදාමේ නිරත වූ මුස්ලිමුන්ට ලංකාවේ ප්‍රදේශ පිළිබඳව මනා අවබෝධයක් විය. එම නිසා මග පෙන්වන්නන් වශයෙන් හා චරපුරුෂයන් වශයෙන් ඔවුන්ගේ සේවය බ්‍රිතාන්‍යයන්ට බොහෝ ප්‍රයෝජනවත් වීය.

සිංහල රජ දවස පටන් මඩිගේ රාජකාරියේ හෙවත් කරත්ත දෙපාර්තමේන්තුවේ සේවය කළ බහුතරයක් මුස්ලිම්වරු වූහ. නව පාලනය යටතේ රාජකාරි ක්‍රමය යටතේ සේවය කිරීමක් නොමැති වුවත් බ්‍රිතාන්‍ය හමුදාවට අහාර සැපයීමේ කාර්යය හා රජයේ වෙළඳ භාණ්ඩ ප්‍රවාහනයේ වගකීම

මුස්ලිම්වරුන්ටම පැවරුණි. මේ නිසා පෙර පැවති තත්ත්වයට වඩා විශේෂ තත්ත්වයක් මුසලිම්වරුන්ට හිමි විය. 1815 දෙසැම්බර් මාසයේදී මුස්ලිම්වරු මහනුවර නගරයේ ආගමික පෙරහැරක් පැවැත්වූහ. පෙර රජ දවස මෙබන්දක් නොතිබුණි. එහිදී බෞද්ධයන් හා ඇති වූ ගැටුමකදී භික්ෂූන් වහන්සේ නමකට අඩන්තේට්ටම් කළ මුස්ලිම්වරු උන්වහන්සේගේ වටාපත ද ඉරා දැමූහ (අභයසිංහ සහ තවත් අය, 1977, 132). මෙම සිදුවීමෙන් මුස්ලිම්වරුන්ට නව පාලනයෙන් හිමි වූ වරප්‍රසාදත් ඒ හරහා ඔවුන් බලවත් භාවයට පත්ව ඇති ආකාරයත් මැනවින් පැහැදිලි වේ. මේ අකාරයට මුස්ලිමුන් බලවත් වූයේ නව පාලනය නිසා බව වටහාගත් උඩරැටියන් තව තවත් බ්‍රිතාන්‍ය පාලනය කෙරෙහි වෛර බඳින තත්ත්වයක් වර්ධනය විය.

ඌව වෙල්ලස්සේ පැවති මුස්ලිම් ජන ව්‍යාප්තිය ගැන සඳහන් කරන මේජර් හාඩි පවසන්නේ ''විශාල සංඛ්‍යාවක්ව සිටි මරක්කල ජාතිකයා, එහෙම පිටින් ම අපේ පැත්ත ගෙන ඇති බැවින්, මේ පළාතට යුධ කණ්ඩායමක් අවශ්‍යයැ යි මම නොසිතමි" යනුවෙනි (ද සිල්වා, 1958, 190). මේ තත්ත්වය යටතේ මුස්ලිම්වරු ද වෙල්ලස්ස ප්‍රදේශයේ මඩිගේ මුහන්දිරම් තනතුරට තමන්ගේ ජාතියේ පුද්ගලයෙකු පත්කරන ලෙස බ්‍රිතාන්‍යයන්ගෙන් ඉල්ලා සිටියහ. ඒ අනුව මේජර් හාඩිගේ යෝජනාවකට අනුව බ්‍රවුන්රිග් විසින් හජ්ජි මරික්කාර් නමැති මුස්ලිම් ජාතිකයෙකු එම තනතුරට පත් කෙරුණි (ඇදගම, 2014, 119). මඩිගේ දෙපාර්තමේන්තුව යටතේ සේවයේ නියුතු වූ බහුතරයක් මුස්ලිම් වෙළෙන්දන් වූ අතර තමන්ගේ කෙනෙකු මුහන්දිරම් තනතුරට පත් වූ බැවින් පෙර සිංහල ප්‍රධානීන්ට ලබාදුන් බදු මුදල් ආදිය ගෙවීම පැහැර හැරිණි. එපමණක්ම නොවේ අත්‍යවශ්‍ය ද්‍රව්‍යයක් වූ ලුණු මෙන්ම අනෙකුත් අවශ්‍ය භාණ්ඩ මුස්ලිම්වරුන්ගෙන් තමන්ට කැමති මුදලකට හෝ බලහත්කාරයෙන් ලබාගැනීමට පුරුදුව සිටි රදළ පිරිසට මේ නිසා දැඩි අපහසුතාවකට පත්වීමට සිදු විය. මෙලෙස ආර්ථිකමය වශයෙන් සිංහල ප්‍රධානීන්ට ගැටලුකාරී තත්ත්වයකට මුහුණ දීමට සිදුවූවා පමණක් නොව සම්ප්‍රදායානුකූලව තමන්ට හිමිව තිබූ තනතුරු වෙනත් පිරිස්වලට ලබා දීම මගින් තම පැවැත්ම අර්බුදයකට ලක්වන බව පැහැදිලිව පෙනෙන්නට විය. මෙය උඩරට ගිවිසුමෙන් පොරොන්දු වී සිටි සම්ප්‍රදායානුකූල නිලතල ආරක්ෂා කරදෙන බවට වූ පොරොන්දුව උල්ලංඝනය කිරීමකි.

උඩරට පැවති සාම්ප්‍රදායික සමාජ ක්‍රමය විදේශිකයන්ගේ ආගමනයත් සමග උඩරැටියා කිසිසේත් බලාපොරොත්තු නොවූ ආකාරයට වෙනස් වීම, බ්‍රිතාන්‍යයන්ගෙන් නිදහස්වීම දක්වා අරගලයක් ආරම්භ කිරීමට මූලික හේතුවයි. මෙම වෙනස්වීම්වලින් ඇති වූ අමිහිරිතාව වැඩි පුරම විඳින්නට සිදු වූයේ භික්ෂූන් වහන්සේලාට සහ ප්‍රභූ පිරිසටය. තත්කාලීන සමාජ ක්‍රමයට අනුව මිනිසුන්ගේ නායකයන් වූයේ මේ දෙපිරිසය. ඔවුන් බ්‍රිතාන්‍යයන් උඩරටට කැඳවාගෙන ආවේ මෙබඳු විපරීතයක් බලාපොරොත්තුවෙන් නොවේ. නිර්මාණය වී ඇති තත්ත්වය ඉබේ වූවක් නොවන නිසා එය නිර්මාණය කිරීමට මූලික වූවන් ලෙස රදළයන්ට, අහිමි වී යන ස්වාධීනතාව දිනාගැනීමට කුමක් හෝ කළ යුතු තත්ත්වයක් කන්ද උඩරට නිර්මාණය වී තිබුණි. එහෙත් රදළවරුන් අතර පැවති අසමගිය හේතුවෙන් ඒ සඳහා නායකත්වය දීමට කිසිවෙකු ඉදිරිපත් නොවීය. කෙසේ නමුත් පූර්වයෙන් සාකච්ඡා කළ කරුණුවලින් පැහැදිලි වන්නේ උඩ රට සමාජයේ සැම ස්තරයකම බ්‍රිතාන්‍යයන්ට එරෙහිව නැඟී සිටීම සඳහා අවශ්‍ය පරිසරය කදිමට නිර්මාණය වී තිබූ බවයි. එහි ආරම්භය 1817 වසරේ මැද භාගයේ ඌව වෙල්ලස්සන් සනිටුහන් වේ.

**1818 අරගලයේ ස්වභාවය හා භික්ෂු දායකත්වය**

1815 බ්‍රිතාන්‍ය සහයෙන් කන්ද උඩරට පාලන

බලය පෙරළා දැමීමට භික්ෂූන් වහන්සේලා විශේෂ සහයෝගයක් දැක් වූ බවට තොරතුරු හමු නොවන අතර විශේෂ විරෝධතාවක් දක්වන ලද බවට ද තොරතුරු හමු නොවේ. එහෙත් බ්‍රිතාන්‍ය-සිංහල සහයෝගීතාවෙන් ගොඩනැඟෙන දෙමුහුන් පාලන ක්‍රමයට එරෙහිව සක්‍රීය නොවුවත් ප්‍රථමයෙන්ම විරෝධතාව ප්‍රකාශ කිරීමට පෙළඹී ඇත්තේ භික්ෂූන් වහන්සේය. 1817-18 වසරවල ඇති වූ අරගලය පිළිබඳව පර්යේෂණය කළ වියතුන්ට මගහැරුණු හෝ ඊට වඩා වැදගත් කාරණා හේතුවෙන් අත්හැර දමන ලද ගැටලුවක් ලෙස වෙල්ලස්සෙන් භික්ෂු මූලිකත්වයකින් අරගලය ආරම්භ වන්නේ කෙසේද යන ගැටලුව හඳුනාගත හැකිය.

බදුල්ලේ උප දිසාපතිවරයා වූ විල්සන් විසින් 1817 සැප්තැම්බර් 16වන දින බදුල්ලේ තානාපති වෙත එවන ලද ලිපියකින් පළමු වතාවට වෙල්ලස්ස ප්‍රදේශයේ මිනිසුන් පිරිසකගේ සැක කටයුතු හැසිරීමක් පිළිබඳව වාර්තා වූ බව බ්‍රවුන්රිග්, යටත් විජිත කාර්යාලයට යැවූ ලිපියක සඳහන් වේ (විමලානන්ද, 2006, 81). එහි එම සැක කටයුතු පිරිස විස්තර කොට තිබෙන්නේ, 'වඩුග ඇඳුමක් හෝ ඇතැම් විට භික්ෂූන්ට අයත් කහ සිවුරක් හෝ අඳින සැක කටයුතු පෙනුමකින් යුතු අමුත්තකු උඩරට සංඝයා සමග දක්නට ලැබේ' යනුවෙනි. වෙල්ලස්ස ප්‍රදේශයේ කිවුලේ ගෙදර මොහොට්ටාල සහ බූටැවේ රටේ රාල ඇතුළු ස්වදේශික ජනයා එකතු වූයේ මෙම සැක කටයුතු පෙනුමෙන් යුත් අමුත්තා වටාය. එම එකතු වීම 1818වන විට බ්‍රිතාන්‍යයන් කන්ද උඩරටින් පළවා හැරීමට තරම් ප්‍රබල විසල් ව්‍යාපාරයක් බවට පත්විය. එනිසා මෙම අරගලයේ මුල පිළිබඳව දැනට අධ්‍යයනය කොට ඇති සීමාවන් ඉක්මවා ගිය අධ්‍යයනයක් සිදු කළ යුතුය.

කන්ද උඩරට බ්‍රිතාන්‍යයන්ට එරෙහිව ජන නැගිටීමක් සිදු වන බවට මුලින්ම අනතුරු අඟවා සිටියේ ආණ්ඩුවේ ප්‍රධාන භාෂා පරිවර්තකයා වූ විලියම් ටොල්ෆි විසිනි. උඩරට කටයුතු පිළිබඳ මනා පරිචයක් ලබා සිටි ඔහු, බ්‍රිතාන්‍ය ආධිපත්‍යය විනාශ කර දැමීම සඳහා රදලවරුන් හා භික්ෂූන් විසින්ද විශාල කුමන්ත්‍රණයක් කරගෙන යන බව උඩරට කටයුතු පිළිබඳ ලේකම්වරයා වූ ජේම්ස් සදර්ලන්ඩ්ට නැවත නැවත දන්වා සිටියේය (ද සිල්වා, 1958, 189). එහෙත් නිතරම භික්ෂූන් වහන්සේලාට චෝදනා කරමින් සිටි ටොල්ෆි 1817 පෙබරවාරි 04වන දින උමතුවෙන් මියගිය බැවින් ඔහු විසින් දැන් වූ කරුණු සම්බන්ධයෙන් එතරම් සැලකිලිමත් වීමක් බ්‍රිතාන්‍ය බලධාරීන් විසින් සිදු නොකරන ලදි. එසේම පූර්වයෙන් සාකච්ඡා කරන ලද 1816දී සිදු වූ බ්‍රිතාන්‍ය විරෝධී අක්‍රීය අරගලයේ ප්‍රධානියා ලෙස කටයුතු කළ ඉහගම රතනපාල හිමියන් මේ වන විට සිටියේ බ්‍රිතාන්‍ය අත් අඩංගුවෙන් මිදී පළාගොස්ය. උන්වහන්සේගේ පළමු සැලසුම වූයේ අග්නි දිග ආසියානු බෞද්ධ රටකින් රජ කුමරෙකු ලංකාවට ගෙන්වා ගැනීමය. එය අසාර්ථක වූ විට උත්සාහ කළේ කොළඹ සිරගතකොට සිටින නායක්කර් වංශයට අයත් කුමාරයෙකු සිහසුනට පත් කිරීමටයි. අරගලය ආරම්භ වීමෙන් පසුව ඒ සඳහා සම්බන්ධ වන රදල පිරිස්වල නාම ලේඛනයක් ද උන්වහන්සේ පැහැදිලිව ඉදිරිපත් කොට තිබුණි. මෙම සැලසුම්වලම කොටසක් වූ මඩුගල්ලේ උඩ ගබඩා නිලමේගේ මූලිකත්වයෙන් මහියංගනයේ සහ කතරගම දේවාලවල ඉංග්‍රීසි ආණ්ඩුව විනාශවී යේවායි වස් කවි කියවීම 1817-18 අරගලයේ පූර්ව සූදානමක් බව හඳුනාගත හැකිය. ඒ බව අරගලය කතරගම දෙවියන් වැඳ පුදා ආරම්භ කිරීමෙන් වටහාගත හැකිය.

1817-1818 අරගලයේ සුවිශේෂී තත්ත්වයක් වන්නේ පැහැදිලි ආරම්භක නායකයෙකු නොමැති වීමයි. එසේ වුවත් අරගලයේ රජු ලෙස පෙනී සිටින පුද්ගලයා පිළිබඳව අධ්‍යයනය කිරීමෙන් මේ සඳහා මූලික වූවන් කවුදැ යි හඳුනාගත හැකිය. ඒ සඳහා මෙම අරගලයේ සියලු පරාසයන් සියුම් ආකාරයට පරීක්ෂා කළ යුතුය.

විලියම් ටොල්ෆිගේ වාර්තාවන්ට අනුව බ්‍රිතාන්‍යයන්ට එරෙහි සටනකට සූදානමක් පැවතියේ කන්ද උඩරටය. එහෙත් බදුල්ලේ උප දිසාපතිවරයාගේ වාර්තාවන්ට අනුව අරගලයක් සඳහා කටයුතු සූදානම් වෙමින් පවතින්නේ ඌවේ ගිනිකොන දෙස වෙල්ලස්ස දේශ සීමාවට ආසන්නවය. මෙම ප්‍රදේශය වසර ගණනාවක් තිස්සේ මහනුවර රාජ්‍ය පාලකයන්ගේ ඍජු පාලනයට හෝ විදෙස් පාලකයන්ගේ ග්‍රහණයට නතු වූ ප්‍රදේශයක් නොවීය. මේජර් හාඩි පෙන්වාදී ඇති ආකාරයට මෙම ප්‍රදේශයේ සම්පූර්ණයෙන්ම තමන්ට පක්ෂපාත මුස්ලිම් ජාතිකයන් බහුලව විසූ ජනපදයක් පැවති බැවින් මෙම පළාතට යුධ කණ්ඩායමක් අවශ්‍ය නොවීය (ද සිල්වා, 1958, 190). එයින් පෙනෙන්නේ මෙම ප්‍රදේශ බ්‍රිතාන්‍ය පාලනය සඳහා කිසිදු තර්ජනයක් එල්ල නොකළ බවයි.

1630දී කුන්ස්තන්තීනූ ද සා පෘතුගීසි කපිතාන්වරයා යටතේ උඩරට යටත් කරගැනීම සඳහා මෙහෙය වූ සේනාව, දෙවන රාජසිංහ ප්‍රමුඛ උඩරට සේනාව අතින් සමූල ඝාතනය වූයේද වැල්ලවාය අසල රන්දෙණිවෙලේදීය. මෙබඳු අතීතයක් සහිත පාලකයන්ගේ ඍජු අධීක්ෂණයට නතු නොවූ ඌව වෙල්ලස්ස, බ්‍රිතාන්‍ය විරෝධී අරගලයට කදිම තෝතැන්නක් විය. එසේම සාම්ප්‍රදායික ජන සම්මතයන්ට අනුව මෙම කලාපය කතරගම දෙවියන්ගේ අඩවියයි. වර්තමානයේ පවා කතරගම දෙවියන්ට මිනිසුන් දක්වන ගෞරවයට සාපේක්ෂව තත්කාලීන ජනයා දෙවියන්ට අතිශයින් බැතිබරව වාසය කරන්නට ඇත. කතරගම දෙවියන්ගෙන් වරම් ලබාගනිමින් අරගලය ආරම්භ කිරීමෙන් පැහැදිලි වන්නේ අරගලය සැලසුම් කළ පුද්ගලයා හෝ පුද්ගලයන් ප්‍රදේශයේ ජන චින්තනය මැනවින් හඳුනාගෙන සිටි බවයි. 1817 දෙසැම්බර් 15වන දින ආණ්ඩුකාර බ්‍රවුන්රිග් විසින් බ්‍රිතාන්‍යයට යවන ලද ලිපියේ "කතරගම දෙවියන්ගෙන් වරම් ලැබ සිටින එසේම එක්තරා බලමහිමයකින් යුක්ත කුමරෙකුට විරුද්ධ වීම පාපයකැ යි සිතා පහත් පන්තියේ බොහෝදෙනා කැරැල්ලට බැදෙන්නාහුය" (විමලානන්ද, 2006, 110-111) යනුවෙන් දක්වා තිබීමෙන්ම පෙනෙන්නේ සටන් සැලසුම්කරුවන් ජන විඥානය ස්වකීය ග්‍රහණයට නතු කරගැනීමට සමත්ව තිබූ ආකාරයයි. මේ තොරතුරු මගින් පැහැදිලි වන්නේ අරගලය සඳහා තෝරාගන්නා ලද ප්‍රදේශය, උපක්‍රමික වශයෙන් අරගලයකට අවශ්‍ය සාධක සම්පූර්ණ කොට තිබූ බවයි.

මීළගට අරගලයේ රජු ලෙස පෙනී සිටි පුද්ගලයා කවුදැ යි විමසිය යුතුය. ඇහැළේපොළගේ හඳුනාගැනීම්වලට අනුව අරගලයේ රජු ලෙස පෙනී සිටින්නේ රාජාධිරාජසිංහ රජුගේ මස්සිනා වන දොරේසාමිය (විමලානන්ද, 2006, 86). මෙම රාජකීය සම්බන්ධතාව අරගලයේ සැලසුම්කරුවන් විසින්ම ප්‍රචාරය කරන ලද්දක් ලෙස හඳුනාගත හැකිය. ලේ සබඳතාවකින් පැවත එන රාජකීය උරුමය බ්‍රිතාන්‍යයන් පලවා හැරීමේ ප්‍රධානතම සාධකයයි. සියලු දෙනා ඒකරාශී වූයේ එම සාධකය වටාය. ස්වදේශික, විදේශික භේදයකින් තොරව සියලු දෙනාම රාජකීය සබඳතාවක් සහිත පුද්ගලයෙකු අරගලයේ මුලසුන හොබවන බව මුලදී දැඩිව විශ්වාස කළහ. එම විශ්වාසය, බ්‍රිතාන්‍යයන්ගේ සටන් කිරීමට ඇති ධෛර්යය හීන කිරීමටත් බ්‍රිතාන්‍යයන් පලවා හැරීමට සටන් වදින මිනිසුන්ගේ ධෛර්යය වර්ධනය කිරීමටත් ප්‍රබල ලෙස බලපෑම් කළේය.

අරගලය, ක්‍රම ක්‍රමයෙන් බ්‍රිතාන්‍යයන්ට කන්ද උඩරට පාලන බලය අහිමි කරවන තරමට ප්‍රබලව වර්ධන වන සමයේ ජෝන් ඩොයිලිගේ චර පුරුෂ සේවය විසින් උක්ත රාජකීය සාධකය පිළිබඳ කරුණු අනාවරණය කරගෙන තිබුණි. ලිඛිත සාධකයන්ට අනුව ඒ පිළිබඳ තොරතුරු ප්‍රථම වතාවට හෙළිවන්නේ ඩොයිලි ලියූ ලිපියකින්මය. අරගලයට සම්බන්ධ වූ උඩුනුවර වැසි කවිකාර මඩුවේ මුහන්දිරම් මෙසේ ප්‍රකාශ කොට තිබේ. "එතුමා මහණ වී සිටි

කෙනෙකු බවත් ආගම ධර්මය ගැන හොඳින් දන්නා බවත් එතුමාගේ කථාවෙන් පෙනුනි. එතුමා විල්බාවේ කපුරාලගේ පුත්‍රයායැ යි දෙතුන්දෙනෙකු රහසින් කියනු ද මට එහි දී අසන්නට ලැබුණි" (විමලානන්ද, 2006, 174) යනු එම ප්‍රකාශනයයි. මීට අමතරව බ්‍රිතාන්‍ය පක්ෂයට හරවාගත් සාමාන්‍ය මිනිසුන්ගෙන් හා අත්අඩංගුවට ගන්නා ලද සිරකරුවන් කිහිප දෙනෙකුගෙන් ද මේ හා සමාන තොරතුරු වාර්තා වී තිබේ (විමලානන්ද, 2006, 99, 178). මේ අතරතුර දේශීය වශයෙන් නව රජු පිළිබඳව පරීක්ෂණ දියත්වන අතරතුර විදේශීය වශයෙන් සත්‍ය දොරේසාමි මධුරාසියේ සිටින බව තහවුරු කරගැනීමට බ්‍රවුන්රිග් ආණ්ඩුකාරවරයා සමත් විය (විමලානන්ද, 2006, 112).

මේ තොරතුරු සත්‍ය වශයෙන්ම තහවුරු කරගැනීම සඳහා ජෝන් ඩොයිලි විසින් යොදාගෙන ඇත්තේ අස්ගිරි විහාරවාසී භික්ෂුවකි. උඩුගම උන්නාන්සේ නමින් හැඳින් වූ මෙම භික්ෂුව, 1830දී පමණ පුස්සේගොඩ උන්නාන්සේ නම් භික්ෂුවකගේ දැනුම් දීමකට අනුව නුවර කලාවියේ දී අත් අඩංගුවට ගත් විල්බාවේ රාලට විරුද්ධව පැවැත් වූ නඩු විභාගයේ දී ස්වකීය ක්‍රියාකාරකම් පිළිබඳව සාක්ෂ්‍ය ලබාදී තිබේ. ආණ්ඩුවේ රහස් නියෝජිතයෙකු ලෙස කටයුතු කළ තමා, බ්‍රිතාන්‍ය විරෝධී අරගලයේ රජු ලෙස පෙනී සිටින්නේයැ යි උපකල්පනය කරන විල්බාවේ නැමැත්තා සොයා සත්කෝරළයේ විල්බාව ප්‍රදේශයට ගිය බව පවසයි. විල්බාවේගේ පවුලේ උදවිය හමු වූ උඩුගම උන්නාන්සේට දැනගැන්මට ලැබී ඇත්තේ අල්ගම උන්නාන්සේ ඇතුළු පිරිසක් සමග විල්බාවේ වන්දනා ගමනක් ගිය බවයි. මග තොරතුරු ඔස්සේ තව දුරටත් විල්බාවේ ඇතුළු පිරිස සොයා ගිය උඩුගමට මොණරාගල ප්‍රදේශයේදී අල්ගම තෙරුන් සමග සිටි වීර වික්‍රම ශ්‍රී කීර්ති යන නමින් අභිෂේක ලබා සිටි රජතුමා දැකගැනීමට ලැබී තිබේ. මෙසේ රජ වී සිටින පුද්ගලයා තමා කලින් හොඳින් දැන සිටි අස්ගිරි විහාරයේ දී උපසම්පදාව ලබාගත් විල්බාවේ උන්නාන්සේ නමින් පෙනී සිටි පුද්ගලයාම බව හඳුනාගැනීමට හැකි බව ප්‍රකාශ කරයි. තවදුරටත් විස්තර සපයන උඩුගම පවසා ඇත්තේ උපසම්පදාව ලබා දෙන අවස්ථාවේ විල්බාවේගේ ජන්ම පත්‍රය පරීක්ෂා කිරීමේ දී ඔහුට රාජ යෝගයක් ඇතැ යි ප්‍රකාශ කෙරුණු බවත්ය (විමලානන්ද, 2006 b, 08-09).

මෙම නඩු විභාගයේදීම සාක්ෂ්‍ය ලබා දුන් පුස්සේගොඩ උන්නාන්සේ කියා සිටියේ 1817 බ්‍රිතාන්‍ය විරෝධී සටන ආරම්භ වීමට අවුරුදු 15කට පෙර සිට විල්බාවේ හඳුනන බවයි. කුඩා කල විල්බාවේගේ ගෝලයෙකුව සිටි ගමගෙදර පුංචි අප්පුගේ සාක්ෂ්‍යවලින් පෙනෙන්නේ හත්කෝරළයේ දෙගලස්සේ වාසය කළ පුද්ගලයෙකු බවත් අල්ගම උන්නාන්සේ සමග කතරගම ගොස් යළි මහියංගනයට එන අතරතුර කිවුලේගෙදර මොහොට්ටාල ඔහු සිවුරු හරවා රජ කරවූ බවයි (විමලානන්ද, 2006 b, 14). සාක්ෂ්‍ය ලබාදෙන විට මොහුගේ වයස අවුරුදු විස්සක් බව සඳහන් නිසා මෙම සිදුවීම වන සමයේ පුංචි අප්පුගේ වයස අවුරුදු හතක් පමණ විය යුතුය. මෙම වන්දනා ගමනට සම්බන්ධ පතගිවත්තේ උන්නාන්සේගේ සාක්ෂ්‍ය දීමේ සඳහන් වන විල්බාවේගේ ගෝලයා ලෙස හඳුන්වන රතනපාල උන්නාන්සේ මෙම පුංචි අප්පු ලෙස හඳුනාගත හැකිය. විල්බාවේ ගැන බ්‍රිතාන්‍යයන්ට සමීප තොරතුරු ලබා දුන් බොහොමයක් දෙනා, රජුයැ යි ප්‍රකාශ කරන පුද්ගලයා සමග කුඩා කුමාරයෙකු ද සිටි බව පවසයි. ඒ විල්බාවේ සමගම සිවුරු හරවා සිටි පුංචි අප්පු විය යුතුය.

විල්බාවේ ගිය වන්දනා ගමන පිළිබඳව තවත් තොරතුරු එම වන්දනා ගමනට සම්බන්ධ වූ පුද්ගලයෙකු ලෙස පතගිවත්තේ උන්නාන්සේගේ සාක්ෂ්‍ය ලබාදීමෙන් හෙළිව තිබේ. තමා සමග අල්ගම උන්නාන්සේ, හොරොම්බුවේ උන්නාන්සේ, යන්තන්පලාවේ උන්නාන්සේ, පනාගොමුවේ උන්නාන්සේ, බමුණුගෙදර උන්නාන්සේ,

රතනපාල උන්නාන්සේ (විල්බාවේගේ ගෝලයා) යන පිරිස ගිය බව පවසයි. එසේම කතරම වැද පුදාගෙන මහියංගන ප්‍රදේශයට පැමිණි විට කිවුලේගෙදර මොහොට්ටාල පැමිණ දින 04-05ක් විල්බාවේ සමග සාකච්ඡා පැවැත්වීමෙන් පසු විල්බාවේ අතුරුදහන් වූ බව ප්‍රකාශ කළේය (විමලානන්ද, 2006 b, 22-23). එම අතුරුදහන් වීමේ දී විල්බාවේ සමග ගොස් ඇත්තේ ඔහුගේ ගෝලයාත් අල්ගම උන්නාන්සේත් පමණි. කිසිවිටක විල්බාවේ අත්හැර නොගිය අල්ගම උන්නාන්සේ විල්බාවේ රජුගේ සෑම නැවතුම් ස්ථානයකදීම තාවකාලික දේවාලයක් තනා දෙමින් ආගමික කටුයුතු ඉටුකර දෙමින් වාසය කොට තිබේ (විමලානන්ද, 2006, 25). මෙම පිරිසේ අනෙක් භික්ෂූන් වහන්සේලා කාලයක් සිරගත කොට සිටි බව හෙළිවන්නේ ජෝන් ඩොයිලිගේ චර පුරුෂයෙකු ලෙස උඩුගම උන්නාන්සේ, විල්බාවේ සොයා යන අතරතුර බුත්තල ප්‍රදේශයේ විහාරයක භික්ෂූන් වහන්සේලා කිහිප නමක් සිරගත කොට සිටිනු දුටු බවත් ඔවුන් කවුරුද, කවරෙකු විසින් සිරකරන ලදදැයි විමසූ විට සත්කෝරළයෙන් පැමිණි පිරිසක් බව නිකමට ප්‍රකාශ කළ නමුත් කවරෙකු විසින් සිරකර තැබුවේදැයි නොපැවසූ බවත් ප්‍රකාශ කොට තිබීමෙනි (විමලානන්ද, 2006, 09). මෙම භික්ෂූන් වහන්සේලා සිරකොට තැබීමෙන් පෙනෙන්නේ 'විල්බාවේ රජු බවට පත්ව ඇත' යන රහස රැකගැනීම බව පැහැදිලිය.

1830 ජුලි 29වන දින විභාග වන නඩුවේදී තමන්ගේ නිදහසට විල්බාවේ විසින් දක්වන ලද කරුණු, විමසීම ද මෙහිදී සිදු කළ යුතුය. නිදහසට කරුණු දැක්වීමේ දී විල්බාවේ ප්‍රකාශ කොට ඇත්තේ තවත් භික්ෂූන් වහන්සේලා හය නමක් සමග කතරගම වන්දනා ගමනක් ගොස් එන අතරතුර කිවුලේගෙදර මොහොට්ටාල විසින් අල්ලාගෙන රජ කමට පත් කරවන ලද බවය. එසේම වෙනත් රජෙකු වැද්දෙකු සේ වෙස් වලාගෙන සිටි බව ද ප්‍රකාශ කළේය (විමලානන්ද, 2006, 16-19). මේ සියලුම කරුණුවලින් මැනවින් තහවුරු වන්නේ 1817-1818 බ්‍රිතාන්‍ය විරෝධී අරගලයේ කේන්ද්‍රය වූ රජු නිර්මාණය වන්නේ විල්බාවේ උන්නාන්සේ නම් භික්ෂූන් වහන්සේ කෙනෙකුගෙන් බවය. උක්ත තොරතුරු පෙන්වා දෙන්නේ මෙම රජු නිර්මාණය වීම ආකස්මිකව සිදු නොවූ බව යි. වන්දනා ගමන අතරතුරදී කිවුලේගෙදර මොහොට්ටාල විසින් බලෙන් තමා සිවුරු හරවා රජු බවට පත්කර ගත් බව සඳහන් කළත් පතාගිවත්තේ උන්නාන්සේගේ සාක්ෂ්‍ය ලබාදීමේ පැහැදිලිවම සඳහන්ව ඇත්තේ දින හතර, පහක් පමණ කිවුලේගෙදරත් විල්බාවේත් අතර ඇති වූ සාකච්ඡාවලින් අනතුරුව විල්බාවේ අතරුදහන්ව ඇති බවයි. එපමණක් නොවේ කතරගම ෙ දවියන්ගෙන් ආශිර්වාද ලබාගැනීමත් මහියංග නය ප්‍රදේශයේදී කිවුලේගෙදර මොහොට්ටාල හමු වීමත් අහම්බ සිදුවීම් නොවේ. සූක්ෂ්ම සැලසුමක කළ එළි බැසීමකි.

රජු බවට පත් වූ විල්බාවේගේ ක්‍රියාකාරකම් අධ්‍යයනය කිරීමෙන් පෙනෙන්නේ ඔහු හුදෙක්ම ප්‍රදර්ශනය සඳහා පමණක් රජෙක් වූ බවය. මන්ද අරගලයේ කිසිදු අවස්ථාවක ඔහුගේ සක්‍රීය මැදිහත් වීමක් සිදු වූ බව හඳුනාගත නොහැකි නිසාය. 1818 සැප්තැම්බර් මාසයේදී මඩුගල්ලේ නිලමේ විසින් තමන්ගේ රජු වශයෙන් කැප්පිටිපොළ සිංහාසනාරූඪ කොට ඇත්තේ විල්බාවේ නම් සීරලුවෙකු බව දැනගෙන කුට ප්‍රයෝගයකින් ඔහු අල්ලා දෑත් දෙපා බැද මහජනයාට ඒ බව අනාවරණ කොට සිටියේය (විමලානන්ද, 2006, 226). මේ අවස්ථාවේ කෙසේ හෝ එතැනින් පැන ගිය විල්බාවේ 1830 අහඹු ලෙස අත් අඩංගුවට පත්වන තෙක් අප්‍රකටව නුවර කලාවියේ වාසය කොට තිබේ (විමලානන්ද, 2006, 19-16). විල්බාවේගේ මෙකී ස්වරූපය ගැන 1830 නොවැම්බර් 21 වන දින ආණ්ඩුකාර එඩ්වඩ් බාන්ස් විසින් රාජ්‍ය ලේකම් ජෝර්ජ් මරේ වෙත යවන ලද ලිපියේ "අන්‍යයන් විසින් ඔවුන්ගේ පක්ෂයට අනුගාමිකයන් බඳවා ගැනීම සඳහා සිත්

ඇදගන්නා දර්ශනයක් හැටියට ඔහු යොදවා ඇති බව දැන් පැහැදිලි ලෙස ඔප්පු වී තිබේ. ඔහු අසහාය බුද්ධියක් හෝ දක්ෂභාවයක් ඇත්තකු ලෙස ද නොපෙනේ" (විමලානන්ද, 2006, 01) යනුවෙන් සඳහන් වේ. මෙය විල්බාවේ සම්බන්ධ සාධාරණ විනිශ්චයක් බව උක්ත කරුණු අධ්‍යයනය මත එකඟ විය හැකිය.

කෙසේ නමුත් මෙම කරුණු හමුවේ ඉස්මතු කෙරෙන ගැටලුව වන්නේ භික්ෂුවක් වූ විල්බාවේ රජෙකු ලෙස භාවිත කිරීමේ උපාය 1818 අරගලයේ ජනප්‍රිය නායකයා වූ කැප්පිටිපොළගේ ම ද යන්නයි. නව රජු පත්කර ගන්නේ කිවුලේගෙදර මොහොට්ටාල විසිනි. ඉන්පසුව මේ වටා එක්වන්නේ බූටැවේ රටේ රාලය. බොහෝ දුරට මොවුන්ගේ සේනාව සමන්විත වූයේ වැදි ජනතාව ප්‍රමුඛ කොටගත් පිරිසකගෙන් බව බ්‍රිතාන්‍ය ලේඛනවල සඳහන් වුවත් ඌව වෙල්ලස්ස ප්‍රදේශයේ ජනතාවගේ ස්වාභාවික ස්වරූපය එය බව කොල්වින් ආර් ද සිල්වා මහතා පෙන්වා දෙයි (ද සිල්වා, 1958, 190). කොහුකුඹුරේ රටේ රාල ද මේ පිරිසට එකතු වීමෙන් පිළිගත් නායකයන් පිරිසකගෙන් සමන්විත සටන් පෙරමුණක් ක්‍රමිකව ගොඩ නැඟෙන ආකාරය හඳුනාගත හැකිය. එම ගොඩනැඟීම සිදුවන්නේ දොරේසාමි හෙවත් විල්බාවේ නම් නව රජු වටාය. මෙම පිරිසේ ප්‍රහාරයට පළමුවෙන්ම නතු වූයේ වෙල්ලස්ස සිංහල ජනයාගේ සිත් රිදවමින් මඩිගේ තනතුරට පත් වූ හජ්ජි මරික්කාර්ය (ද සිල්වා, 1958, 81). ඊළග ප්‍රහාරය ඔවුන් අත්අඩංගුවට ගැනීමට පැමිණි බදුල්ලේ උප දිසාපති විල්සන්ට එල්ල කෙරිණි (ද සිල්වා, 1958, 82). මෙම පහර දීම් අරගලය ආරම්භ කිරීමේ සංඥාවන් ලෙස හඳුනාගත හැකිය. කෙසේ වෙතත් මෙම ප්‍රහාර කල් තියා සූදානම් කළ ප්‍රහාර නොවේ. අරගලකරුවන් සොයා පැමිණි පිරිස් වෙත ලබා දෙන ලද පිළිතුරුයි.

රජෙකු සිටීමත් තම ප්‍රතිවාදීන්ට නොබියව පහර දීමත් නිසා වෙල්ලස්ස ප්‍රදේශයේ ජනයා අතර ස්වාධීනතාව දිනාගැනීම පිළිබඳ උද්‍යෝගය ඇතිවීම ස්වභාවිකය. මෙම සිදුවීම් ඇතිවන්නේ 1817 සැප්තැම්බර් මස අගදී සහ ඔක්තෝම්බර් මස මුලදිය. මෙම කිසිදු සිදුවීමක් සඳහා ප්‍රධාන මෙහෙයවන්නෙකු සිටි බවට ඡායා මාත්‍ර සංඥාවකුදු හමු නොවේ. බොහොමයක් ඉතිහාසඥයන්ගේ මතයට අනුව මෙම සිදුවීම් සැලසුම් සහගතව සිදු වූ ඒවා නොවේ. හජ්ජි මරික්කාර්ට එල්ල කළ ප්‍රහාරය සහ උප දිසාපති විල්සන්ට එල්ල කළ ප්‍රහාර සම්බන්ධයෙන් ඉතිහාසඥයන්ගේ මතය හා එකඟ විය හැකි වුවත් නව රජෙකු බිහිවීම සම්බන්ධයෙන් එසේ එකඟ විය නොහැකිය. මක්නිසාද එය පැහැදිලිවම සැලසුම් සහගත ක්‍රියාවක් බව කරුණු සහිතව ඔප්පු වන බැවිනි. රජෙකු බිහි කොට බ්‍රිතාන්‍යයන් පලවාහැරීමේ සැලැස්මක් පිළිබඳ තොරතුරු 1816දී වාර්තා වීම පිළිබඳව පූර්වයෙන් සාකච්ඡා කර ඇත. එහි ප්‍රධාන සැලසුම්කරුවා වූ ඉහගම හිමියන් අත් අඩංගුවෙන් මිදී පලාගොස් සිටි අතර උන්වහන්සේ පිළිබඳව යළිත් තොරතුරු හමුවන්නේ බ්‍රිතාන්‍ය විරෝධී සටන්කරුවන්ට දඬුවම් නියම කරන යුධ අධිකරණ ක්‍රියාවලිය සිදුවන අවස්ථාවේදී (විමලානන්ද, 2006 b, 152-153) සහ 1819 මැයි පළමුවන දින කතරගම දේවාලයේ හිටපු මහබෙත්මේගෙන් මේජර් මැක්ඩොනල්ඩ් සහ හෙන්රි රයිට් විසින් විමසන ලද ප්‍රශ්නවලට පිළිතුරු ලබා දීමේ දීත්ය (විමලානන්ද, 2006 b, 370-387). මෙහි දී අවධානය යොමු කළ යුතු තවත් වැදගත් කාරණාවක් වන්නේ ව්‍යාජ රජු සහ ඉහගම අතර පවතින සම වයස් සබඳතාවයි. 1816 අක්‍රීය අරගලය පිළිබඳ තොරතුරු අනාවරණය කරන එක්නැලිගොඩගේ තොරතුරු දැක්වීම්වල සටහන්ව ඇත්තේ අවුරුදු තිහක් නොවූ භික්ෂු නමක් තමා හමුවීමට පැමිණි බවය (විමලානන්ද, 2006 b, 20). ව්‍යාජ රජු සියැසින් දුටු හලියද්දේ යටිනුවර සට්ටම්බි සාක්ෂ්‍ය දෙමින් පවසා තිබුණේ රජු වයස

අවුරුදු තිහත් විසිඅටත් අතර පුද්ගලයෙකු බවයි (විමලානන්ද, 2006 b, 178). ඒ අනුව දෙදෙනා සම වයසේ වූවන් බව තහවුරු වේ. එක්නැලිගොඩ, ඉහගම හිමියන්ට ස්ථිර පන්සලක් නොමැති බව ප්‍රකාශ කළත් ඩොයිලි විසින් උන්වහන්සේ අත්අඩංගුවට ගන්නේ මල්වත්තේ විහාරයේදීය. විල්බාවේ අස්ගිරිය විහාරයට අයත් භික්ෂුවකි. සම වයසේ වීමත් සමීපයේ වාසය කිරීමත් හේතුවෙන් මෙම දෙදෙනා අරගලයට පෙර පටන්ම හමුවීමට තිබෙන හැකියාව ඉතා ඉහළය. මෙම තොරතුරුවලින් ඉහගම, රජුගේ සමීපයේ සිටි බවත් අරගලයට සක්‍රීයව සම්බන්ධවී ඇති බවට තොරතුරු හමුවන බැවිනුත් අරගලයට පෙර හැඳුනුම්කම් පැවති බවට උපකල්පනය කළ හැකි බැවිනුත් ව්‍යාජ රජෙකු නිර්මාණය කිරීමේ සැලසුමේ ප්‍රමුඛයෙකු වශයෙන් හඳුනාගත හැකිය. ඒ අනුව දොරේසාමි නිර්මාණය කිරිමේ වැඩි ගෞරවය හිමි විය යුත්තේ කැප්පිටිපොළට නොව ඉහගමටය.

අරගලයේ තීරණාත්මක අවස්ථාවකදී මඩුගල්ලේ නිලමේ විසින් රජු පිළිබඳ රහස අනාවරණය කිරීම ද මෙහිදී විමසිය යුතුය. භික්ෂූන් වහන්සේලා සමග සමීප සබඳතා පවත්වමින් භික්ෂූන් ලවා බ්‍රිතාන්‍ය ආණ්ඩුවට එරෙහිව වස් කවි කියවමින් දළදාව මාළිගාවෙන් බැහැර කරවන ලෙස මහා නායක හිමියන්ට යෝජනා කරමින් ඉහගම සමග 1816 දී බ්‍රිතාන්‍ය රජය පෙරළා දැමීමේ අක්‍රීය අරගලයේ සක්‍රීය චරිතයක් වූ මඩුගල්ලේ උඩගබඩා නිලමේ බ්‍රිතාන්‍ය විරෝධී අරගල සිදුවන විට සිටියේ වසර දෙකක සිරදඬුවම් නියමව නිසා ඔහුට මෙම තොරතුරු පිළිබඳව දැනුවත් වීමට අවකාශයක් නොවීය. මඩුගල්ලේ හිරෙන් නිදහස්ව පැමිණි විගස ආරම්භව තිබූ සටනට සම්බන්ධව නායකත්වය දෙමින් කටයුතු කළා විනා රජු මුණගැසීමක් සිදු නොවීය. සටන අතර මගදී එයට එකතු වූ මොහුට ඒ පිළිබඳව පූර්ණ අවබෝධයක් කෙසේවත් ඇතිවිය නොහැකිය. එසේම අරගලය අවසාන භාගයේදී විනා එහි නායකයන් එකට හමුවීමක්ද සිදු වී නැත. එම හේතුවෙන් අරගලය ක්‍රියාත්මක විය යුතු ආකාරය පිළිබඳ නිශ්චිත එකඟතා දැකගත නොහැකිය. එසේම සටනේ ස්වභාවය පිළිබඳව ද නිශ්චිත අවබෝධයක් නායකයන්ට තිබූ බව ද නොපෙනේ. එසේ වූයේ නම් වාරියපොල සුමංගල හිමියන් විසින් මහනුවර මාළිගාවෙන් උපක්‍රමශීලීව ලබාගන්නා ලද දළදාව, හඟුරන්කෙතදී දැවැන්ත ජන සහභාගීත්වයකින් ප්‍රදර්ශනය කොට (විමලානන්ද, 2006 a, 138,140) සම්මතය අනුව රට තමන්ට අයත් බව තහවුරු කරමින් සිටි අවස්ථාවක, මුළු මාතලේ දිසාවම සටන්කරුවන් යටතට පත්කරගෙන සිටි අවස්ථාවක, 1818 සැප්තැම්බර් මාසයේදී දුම්බර මහවැලිගල ඉඩමේ දී මඩුගල්ලේ විසින් අරගලයේ කේන්ද්‍රය වූ ව්‍යාජ රජු පිළිබඳ සත්‍ය මහජනයා ඉදිරිපිට අනාවරණය නොකරනු ඇත (විමලානන්ද, 2006 b, 224,226). විශේෂයෙන්ම භික්ෂූන් සමග සමීප සබඳතා පැවැත් වූ මඩුගල්ලේ, හීරලුවෙකු රජු බවට පත්කිරීම කැප්පිටිපොළගේ සෘජු සබඳතාවකින් නොව භික්ෂූන් වහන්සේලාගේ සෘජු දායකත්වයකින් සිදු වූවක් බව නොදැන සිටීමත් අරගලයට ජීවය සැපයූ 'රජු' සංකල්පය මිත්‍යාවක් බව පෙන්වා දීමත් අරගලය අසාර්ථක වීම සඳහා බලපෑ ප්‍රධානතම කාරණයක් ලෙස හඳුනාගත හැකිය. මෙම සිදුවීමෙන් මාසයකට ආසන්න කාලයකට පසුව 1817-18 අරගලය සම්පූර්ණයෙන්ම මර්දනය කිරීමට බ්‍රිතාන්‍යයෝ සමත් වූහ.

සියවස් විසිපහක රාජාණ්ඩුකරණ දේශපාලන ඉතිහාසයක් සහිත ශ්‍රී ලංකාවේ පැහැදිලි නායකයෙකු නොමැතිව අරම්භ කරන ලද ප්‍රථම අරගලය 1817-18 අරගලයයි. භික්ෂූන් වහන්සේලා කිහිප නමක් ආරම්භ කළ මෙම අරගලය ජන ප්‍රධානීන්ගේ සහභාගීත්වයෙන් සිවිල් අරගලයක් දක්වා පරිවර්තනය විය. අරගලය අසාර්ථක වුවත් ඒ සඳහා භික්ෂූන්ගේ දායකත්වය විවිධාකාරයෙන්

සිදුව තිබේ. කතරගම හිටපු මහබෙත්මේ රාල විසින් 1819 මැයි මස 01වන දින නැගෙනහිර පළාත් බාර 19වැනි බල ඇණියේ අණ දෙන නිලධාරී මේජර් මැක්ඩොනල්ඩ්ට සහ ඌව, වෙල්ලස්ස හා බින්තැන්න පළාත් බාර බලයලත් ඒජන්තවරයා වන හෙන්රි රයිට් මහතාට ලබා දෙන ලද පිළිතුරුවලින් කෙබඳු භික්ෂූන් පිරිසක් අරගලය වටා එකතුව සිටියේදැ යි මතු කරගත හැකිය. මෙම තොරතුරු ලබා දීමේ විශේෂත්වය වන්නේ දේවාලයේ ප්‍රධානියා වශයෙන් ප්‍රදේශයේ බොහෝ තොරතුරු පැහැදිලිව දැන සිටීමත්, අරගලයට සම්බන්ධ පුද්ගලයන්ගේ විශාල ප්‍රමාණයකගේ තොරතුරු අනාවරණය කොට තිබීමත්ය.

මහ බෙත්මේ මුලින්ම ව්‍යාජ රජු මුණගැසෙන අවස්ථාවේ එහි ඔලුපැලියාවේ උන්නාන්සේ, කොළඹ උන්නාන්සේ, ගාල්ලේ උන්නාන්සේ, රද්ගල්ලේ උන්නාන්සේ, ඔලුපැලියාවේ පුංචි උන්නාන්සේ, රජ්ජුරුවන්ගේ පුතා හීන් හාමුදුරුවෝ සහ කොළඹ උන්නාන්සේ යනුවෙන් භික්ෂූන් වහන්සේලා හත් නමක් සිටි බව ප්‍රකාශ කොට තිබේ (විමලානන්ද, 2006 b, 370-389). කතරගමට පැමිණීමට පෙර විල්බාවේ කොළඹ, ගාල්ල හා සබරගමුව හරහා පැමිණි බව මහ බෙත්මේ හෙළිකරන හෙයින් පූර්වයෙන් සඳහන් කළ කොළඹ උන්නාන්සේ සහ ගාල්ලේ උන්නාන්සේ ආදීන් එම ගමනේදී මෙම අරගලය වටා එකතු වන්නට ඇත. නම් සඳහන් වන මෙම භික්ෂූන් වහන්සේලා දෙනම පහතරට ප්‍රදේශයෙන් මෙම අරගලයට සම්බන්ධ වූ බව උපකල්පනය කළහැකි නමුත් උන්වහන්සේලා පිළිබඳව වැඩි තොරතුරක් වෙනත් කිසිඳු අවස්ථාවක වාර්තා නොවේ. මීට අමතරව අඹඇල්ලේ උන්නාන්සේ, මොනරවානේ උන්නාන්සේ සහ කතරගම අවුරුදු 05ක් පමණ වාසය කළ දුම්බර උන්නාන්සේ රජ්ජුරුවන්ගේ ගබඩා නිලමේ පදවිය දරමින් සිටි බව මෙම පිළිතුරු ලබා දීම් තුළ දැක්වේ. මහ බෙත්මේ රාල මෙම භික්ෂූන් දැක තිබුණේ පළමු වර ව්‍යාජ රජු මුණගැසීමට 1817 ඔක්තෝම්බර් මාසයේ වෙල්ලස්සට ගිය අවස්ථාවේදීය.

දෙවන වතාවට ඔහු රජු මුණගැසෙන්නේ මොණරාගල ප්‍රදේශයේදීය. එහිදී අඛණ්ඩව දින තිහක් පමණ රජු සමීපයේ වාසය කිරීමට අවස්ථාව ලබා ඇත. එම කාලයේ රජු සමග කටයුතු කළ භික්ෂූන් වහන්සේලා හත් නමකගේ තොරතුරු හෙළිකරයි. ඒ මොනරාගල උන්නාන්සේ, වත්තේගම උන්නාන්සේ, මුප්පනේගම උන්නාන්සේ, මැදගම උන්නාන්සේ, නාපේ උන්නාන්සේ, තුම්පනේ උන්නාන්සේ සහ අස්ගිරි විහාරයට අයත් හමුදුරු නමක් වශයෙනි. මෙම භික්ෂුව විල්බාවේ සමගම වෙල්ලස්සට පැමිණ ඔහු යන යන තැන තාවකාලික දේවාලයක් තනා ආගමික කටයුතු සිදුකර දුන් අල්ගම හිමියන් විය යුතුය. මෙම භික්ෂූන් වහන්සේලාට අමතරව නිතර නිතර සන්දේශ රැගෙන භික්ෂූන් වහන්සේලා රජු හමුවීමට පැමිණ තිබේ. එසේ පැමිණි එක් භික්ෂුවක් ඇහැළේපොළගේ සන්දේශයක් රැගෙන විත් රජු වාසනාවන්තයෙක් නම් ඇහැළේපොළත් ඔහු හා එකතු වීමට කැමැත්තෙන් සිටින බව තමා ඉදිරිපිටදීම කැප්පිටිපොළට ප්‍රකාශ කළ බව මහ බෙත්මේගේ පිළිතුරුවල අඩංගු වේ. බ්‍රිතාන්‍ය විරෝධී අරගලය සඳහා ඇහැළේපොළ සම්බන්ධ වූ බවට විවිධ මත පැවතියත් ඔහු සම්බන්ධ බවට ඉදිරිපත් වන ප්‍රබල නොවූවත් එකම සාක්ෂ්‍යය මෙය ලෙස හඳුනාගත හැකිය.

මහ බෙත්මේගේ පිළිතුරු ලබාදීමෙන් මතු වන තවත් වැදගත් තොරතුරක් වන්නේ රජු වෙනුවෙන් සියලු ලියුම් ගනුදෙනු සිදුකර ඇත්තේ කැප්පිටිපොළ බවත් එම ලියුම් හුවමාරු කිරීමේ නිරතව සිටියේ භික්ෂූන් වහන්සේලා බවත්ය. යුධමය ක්‍රියාවලියක් පවතින අතරතුර සිදුවන පණිවිඩ හුවමාරුව එහි ප්‍රධානතම අත්‍යවශ්‍ය සේවාවකි. ඒ සඳහා සැම විටම භාවිත කෙරෙන්නේ විශ්වාසවන්තම පුද්ගලයන්ය. ඒ අනුව මෙම අරගලයේ විශ්වාසම කණ්ඩායමක් ලෙස

භික්ෂූන් කටයුතු කොට ඇති බව පැහැදිලිය.

බ්‍රිතාන්‍ය විරෝධී අරගලයට සම්බන්ධ වීම හේතුවෙන් දඬුවම් වශයෙන් යාපනයේ රඳවා තැබිය යුතු යැයි ආණ්ඩුකාරයා කල්පනා කරන භික්ෂූන් වහන්සේලා 18 දෙනෙකුගේ නාම ලේඛනයක් 1820 පෙබරවාරි 25 වැනි දින එඩ්වඩ් බාන්ස් විසින් බ්‍රිතාන්‍යයට යවන ලද අංක 05 දරන සන්දේශයේ ඇතුළත්ව තිබේ (විමලානන්ද, 2006, 176-177). එහි නාපේ, පල්ලේගම, මැදගම යන භික්ෂූන් වහන්සේලා හඳුන්වා ඇත්තේ භයානක පුද්ගලයන් වශයෙනි. මුල සිටම ව්‍යාජ සිංහාසනාපේක්ෂකයාට සහාය වූ මොවුහු අත්අඩංගුට ගන්නා තුරුම, ඔහුට ආධාර කිරීමෙහි යෙදී සිටියෝය. පෙර සාකච්ඡා කළ කතරගම මහබෙත්මේගේ සාක්ෂ්‍ය ලබාදීමේ නාපේ උන්නාන්සේ සහ මැදගම උන්නාන්සේ දොරේසාමි රජු සමීපයේ සිටි බව හෙළිකොට තිබේ. දළදා මාළිගයෙන් දන්ත ධාතුව පැහැරගෙන යාමේ වරදට වාරියපොල මහ තෙරුන්නාන්සේත් යාපාපටුනේ රඳවා තැබීමට යෝජනා වී තිබුණි. සටන ආරම්භයේ සිටම ව්‍යාජ රජුට පක්ෂපාතව ක්‍රියා කරමින් මඩුගල්ලේ නිලමේ විසින් දුම්බරදී ව්‍යාජ රජු අල්ලා අත් අඩංගුවට ගත් අවස්ථාවේ ඔහුට පැනයාමට උදව් කළ නිසා මුප්පනේ තෙරුන්නාන්සේ, හුලුගල්ලේ තෙරුන්නාන්සේ, අඹගල්ලේ තෙරුන්නාන්සේ, පොල්වත්තේ මහ තෙරුන්නාන්සේ, බදුලුවෙලේ තෙරුන්නාන්සේ, ඊතණවත්තේ මහ තෙරුන්නාන්සේ යන භික්ෂූන්ට ද උක්ත දඬුවමට යටත් වීමට සිදුවිය. (මුප්පනේ තෙරුන්නාන්සේ පිළිබඳව කතරගම මහබෙත්මේගේ සාක්ෂි දීමේ ද ඇතුළත් වේ.) කරුවලගස්වැවේ මහ තෙරුන්නනාන්සේ, වඩුපොල මහ තෙරුන්නාන්සේ සහ කැටකුඹුරේ තෙරුන්නාන්සේට එම දඬුවමට යටත්වීමට සිදුව ඇත්තේ අරගලයේ ප්‍රසිද්ධ සටන්කරුවෙකු වූ කොබ්බෑකඩුවට හතරකෝරළයේ තම විහාරස්ථානයේ රැකවරණය ලබා දීම හේතුවෙනි. මිනිසුන් ප්‍රකෝපකිරීමට කටයුතු කළේය යන චෝදනාව යටතේ දම්බරාවේ තෙරුන්වහන්සේගේ නම ද උක්ත ලේඛනයට ඇතුළත් කොට තිබේ. ගල්කඩවල මහ තෙරුන්නාන්සේ, බමුණුගෙදර මහ තෙරුන්නාන්සේ, වල්පලුවෙ තෙරුන්නාන්සේ, අන්දරවැවේ තෙරුන්නාන්සේ හා ගල්කඩවල සාමණේර යන භික්ෂූන් වහන්සේලාට යාපා පටුනේ රඳවා තැබීමේ දඬුවමට යටත් වීමට සිදු වූයේ අරගලයට සහයෝගය දැක්වීය යන චෝදනාව යටතේය. මෙම භික්ෂූන් වහන්සේලා අත් අඩංගුවට ගෙන තිබෙන්නේ මාතර ප්‍රදේශයේදීය. සත්කෝරළයේ වැඩ බලන දිසාපතිව සිට මියගිය ඩබ්ලිව්. මර්ෆිගේ වාර්තාවකට අනුව පෙනෙන්නේ මෙම භික්ෂූන් අරගල සමයේ ස්වකීය විහාරස්ථානවල රැඳී නොසිටි බවත් කන්ද උඩරට ප්‍රදේශයේ වාසය කළ බවට සාධක ඇති බවයි. මෙයින් තහවුරු වන්නේ බ්‍රිතාන්‍යයන් අරගලය සක්‍රීයව පැවති කන්ද උඩරට භික්ෂූන් වහන්සේලා පිළිබඳව පමණක් නොව තදාසන්න ප්‍රදේශයන්හි භික්ෂූන් පිළිබඳව ද අවධානයෙන් සිටි බවයි.

පෙර නම් සඳහන් අඹගල්ල උන්නාන්සේ සිරභාරයට ගත් සයිමන් සෝවර්ස්, ''පසුගිය කැරැල්ල අරඹන ලද්දේ භික්ෂූන් විසිනි. ඒ නිසා රටට පාඩමක් ඉගැන්වීමට මේ මිනිසාට වඩා පුද්ගලයෙක් නැත. මොහුගේ කහ සිවුරේ ශුද්ධත්වය ගැන නොතකා මරා දැමිය යුතුය. එසේ නැතහොත් අනාගතයේදී අපට මොවුන්ගෙ න් කිසිවක් බලාපොරොත්තු විය නොහැකිය. මෙතෙක් අප රජයට විරුද්ධව මොවුන් කළ පරිදි අනාගතයේ දී ද හැම පන්සලක් ම කුමන්ත්‍රණය හා රාජද්‍රෝහීකම පිළිබඳ උල්පත් වනවාට කිසිදු සැකයක් නැත.''(විමලානන්ද, 2006 b, 230) යනුවෙන් ඩොයිලිට ලියා දැන්වීය. සෝවර්ස්ගේ මෙම ප්‍රකාශනයෙන් තත්කාලීනව ඉංග්‍රීසි නිලධාරීන්, භික්ෂූන් වහන්සේ සහ පන්සල සම්බන්ධයෙන් දරන ලද මතය කදිමට නිරූපණය වේ. බ්‍රිතාන්‍යයන්ගේ පාර්ශ්වයෙන් බලන විට

එබඳු මත දැරීම අසාධාරණ නොවන බව පෙනේ. බ්‍රිතාන්‍යයන් පලවා හැරීම සඳහා මූලිකත්වය ගන්නේත් ජනමතය සකසමින් එයට අවශ්‍ය කරන මතවාදීමය නායකත්වය ලබා දෙන්නේත් පන්සල කේන්ද්‍ර කොටගත් භික්ෂූන් වහන්සේලා නිසා බව ඒ වන විට ඔවුන් සාධාරණ සැකයකින් තොරව තහවුරු කරගෙන සිටි බැවිනි. එසේම 1819 අප්‍රේල් 24වන දින ආණ්ඩුකාර බ්‍රවුන්රිග් විසින් බ්‍රිතාන්‍යයට යවන ලිපියකින් පෙන්වා දෙන්නේ "වෙල්ලස්සේ භික්ෂූන් තුළ බ්‍රිතාන්‍ය ආණ්ඩුව කෙරෙහි තදින් මුල් බැසගත් එදිරිවාදිකමක් තිබේ. මේ සංසයා විසින් කැරැල්ල හා සම්බන්ධ පුද්ගලයන් උනන්දු කරවන ලද බවත් ගම්වැසියන්ට සිය ගේ දොර අතහැර වනගත වීමට උපදෙස් දෙන ලද බවත් කපිතාන් රිච් විසින් අනාවරණය කළෙන් ඔවුන් දස දෙනෙකු පමණ අත් අඩංගුවට ගැනීමට අවසර දීමට සිදුව තිබේ. මොවුන් අතරෙන් ඇතැමෙක් යට කී ශ්‍රමණ වේශධාරයාගේ සහචරයෝ වෙති. ඔවුන් අල්ලාගත් සැණෙකින් ගම් වැසියෝ සිය නිවෙස් බලා අවුත් සුපුරුදු සාමගරුක කටයුතුවල නිරත වූහ. මෙබදු භික්ෂූන් මතුවටත් කළ හැකි කුමන්ත්‍රණ වළක්වාලීම උදෙසා මහනුවර දළදා මාළිගයෙහි තැන්පත් කොට ඇති දන්ත ධාතූන් වහන්සේ යාපනේ කොටුවෙහි සඟවා තැබීම අවශ්‍යය යි මම කල්පනා කළෙමි. යාපනය, සංසයාගේ බලපෑමට යටත් ප්‍රදේශයක් නොවන හෙයිනි" (විමලානන්ද, 2006 ඉ, 354) යනුවෙනි. භික්ෂුව ඉංග්‍රීසීන් කෙරෙහි දක්වන ප්‍රතිචාරයත් ගම්වැසියා හා භික්ෂුව අතර පවතින සබඳතාවත් දළදා වහන්සේ මේ සියල්ලට කරන බලපෑමත් යන කරුණු කාරණා පිළිබඳව බ්‍රිතාන්‍යයන් සතුව පැවති ආකල්පය මෙමගින් මැනවින් පිළිබිඹු වේ. එහිදී සක්‍රීය සාධකය වන භික්ෂුව මර්දනය කිරීම, අරගල සන්සිඳවීමේ හොඳම මාවත ලෙස බ්‍රිතාන්‍යයන් තෝරාගෙන තිබේ.

අරගලයට සම්බන්ධ වූවන්ට දඬුවම ලබා දීම විවධ ආකාරයෙන් සිදු විය. මරණ දණ්ඩනය උපරිම දඬුවම වූ අතර පිළිවෙළින් මුරිසි දිවයිනට පිටුවහල් කිරීමත්, යාපනයේ රඳවා තැබීමත් දරුණු දඬුවම් ලෙස ක්‍රියාත්මක විය. සටන කෙරීගෙන යන අතරතුර හමුදා අධිකරණය මගින් 47 දෙනෙකු මරණයට පත්කොට 06 දෙනෙකු පිටුවහල් කොට 08 දෙනෙකුට සුළු දඬුවම් පමුණුවා තිබුණි. ඒ බ්‍රිතාන්‍යන්ගේ නිල ලේඛනවල සඳහන් ආකාරයයි. නමුත් මෙම අරගලය මර්දනය කිරීමට මෙම ලේඛනවල සඳහන් දඬුවම් ක්‍රමයන්ට අමතරව නිර්දය ක්‍රියාමාර්ග අනුගමනය කර ඇති බව තහවුරු වේ. එම ක්‍රියාමාර්ග නීත්‍යනුකූල බවට පත්කරනු ලැබුවේ 1818 පෙබරවාරි 21වන දින පනවන ලද යුධ නීතිය පැනවීමේ ආඥාව මගිනි. එමගින් වරක් බ්‍රවුන්රිග් ආණ්ඩුකාරවරයාම උඩරට උද්‍යානය, ධාන්‍යාගාරය (සිංහල විශ්වකෝෂය- සිවුවන කාණ්ඩය, 1970, 402) ලෙස හැඳින් වූ ඌව වෙල්ලස්ස 1819 වන විට නිසරු ජන ශූන්‍ය කලාපයක් බවට පත් විය. එය ක්‍රියාත්මක වූ අකාරය ඉංග්‍රිසි ලේඛකයෙකුම දක්වා ඇත්තේ මෙසේය. " කැරැල්ල කෙරීගෙන ගිය ස්වරූපය පිළිබඳව ඉංග්‍රීසි පාඨකයාට නිවැරදි චිත්‍රයක් දැක්වීම අපහසු ය. කෙසේ වුව ද සටන් උග්‍ර වන විට එය බලය යොදා මර්දනය කළ බව සඳහන් කළ යුතුය. යුධ නීතිය ප්‍රකාශයට පත්කරන ලදි. සටන් ආරම්භ වූ ප්‍රදේශවල යුධ මුරපොළ ආරම්භ කර භටයන් රදවන ලදි. යුධ නීතිය ප්‍රකාශයට පත් කිරීමෙන් ලත් බලය සියතට ගත් භටයන් එය මර්දනය කිරීමේ පහසු මගක් වශයෙන් ගම් බිම් ගිනි තබා විනාශයට පත් කළහ. කුඹුරු ඇළ වේලි විනාශ කර එල දරන ගස් කපා බිම හෙළා වැසියන් බියට පත් කරමින් සාගින්නේ තබමින් අත්තනෝමතික ලෙස කටයුතු කළහ. අවි ආයුධ අත දරා සිටි මිනිසුන් දුටු තැන වෙඩි තබා ඝාතනය කිරීමේ නිදහස සිත් සේ ක්‍රියාවට නැංවූහ" (Davy, 2008, 191-192) යනුවෙනි. මෙම නිසා විනාශයට පත් වූ සටහන් නොමැති මිනිස් ජීවිත සංඛ්‍යාව දස දහසක් පමණ විය හැකි බව අනුමාන කරයි (Davy, 1821, 331).

කෙසේ වෙතත් වාර්තා වී ඇති දඬුවම් ලබාදීම්වලට අනුව භික්ෂූන්ට ලබාදී ඇති ඉහළම දඬුවම වන්නේ යාපනයේ සිරකොට තැබීමයි. ඒ හැරෙන්නට අරගලයේ ක්‍රියාකාරී වූ භික්ෂු සංස්ථාව නියෝජනය කළ අය අතුරින් ඉහළම දඬුවමක් නියම වන්නේ ඉහගමටය. අරගලයේ ප්‍රධාන නායකයින් වූ කැප්පිටිපොළ, මඩුගල්ලේ, පිළිමතලාවේ හා ඉහගම යන සිවුදෙනාගේ හිසගසා දැමීමට නියම විය. එහෙත් පසුව පිළිමතලාවේගේ සහ ඉහගමගේ දඬුවම් මුරිසි දිවයිනට පිටුවහල් කිරීම දක්වා වෙනස් වුණි. මුරිසියට පිටුවහල් කිරීමට නියමිත සිරකරුවන්ගේ නාම ලේඛනයේ ඉහගම පිළිබඳව සඳහන්ව ඇත්තේ "එක් අවධියක දී සිවුරේ සිටි තැනැත්තෙකි. යුද්ධාධිකරණය විසින් මරණීය දණ්ඩනය නියම කරන ලද නමුදු දෙවනුව පිටුවහල් කිරීමට තීරණය කරන ලදි. ප්‍රයෝග කුමන්ත්‍රණ කාරයෙකු වන මෙම පුද්ගලයා සැලකිය යුතු පවුලකට අයත් නොවේ. එහෙත් 1816 කුමන්ත්‍රණයට සම්බන්ධ මොහු කැරැල්ලේ දී ඉතා උනන්දු විය" (විමලානන්ද, 2006 b, 153) යනුවෙනි. අරගලයට සම්බන්ධව කටයුතු කළ අය අතුරින් කිසිවෙකුවත් හැඳින්වීම සඳහා භාවිත නොකරන යෙදුමක් ඉහගම හැඳින්වීමට භාවිත කර තිබේ. එනම් ප්‍රයෝග කුමන්ත්‍රණ කරුවෙකු යන්නයි. එසේ හඳුන්වා ඇත්තේ අප්‍රකටව සාක්ෂ්‍ය හමු නොවන ආකාරයට කටයුතු කිරීමේ හේතුව නිසාම විය යුතුය. 1817-18 අරගලයේ සටන්කරුවන් අතරින් ඉහගම විශේෂ වීමට තවත් හේතුවක් වන්නේ අරගලයේ මුල සිට අවසානය දක්වාම සිටි ප්‍රධාන පෙළේ එකම නායකයා මොහු වීමයි. සාම්ප්‍රදායික සමාජ ක්‍රමයේ කුලය පදනම් කරගත් පාරම්පරික පවුල් පාලන ක්‍රමයකට නතුව පැවති සමයේ සැලකිය යුතු පවුලකට අයත් නොවූවත් අරගලයට නායකත්වය ලබා දෙන පුද්ගලයෙකු බවට පත්වන්නේ ඉහගම භික්ෂුවක වශයෙන් සිටි කාලවකවානුවේ නිර්මාණය කරගත්තා ලද ප්‍රතිරූපය මත විය යුතුය.

උක්ත දඬුවම් ලබාදීම් හැර භික්ෂූන්ට වෙනත් දඬුවම් නියම කිරීම් පිළිබඳව තොරතුරු හමු නොවේ. අරගලයට සම්බන්ධ අනෙකුත් සටන්කරුවන්ට ලබා දී ඇති දඬුවම්වලට සාපේක්ෂව අරගලයට සම්බන්ධ භික්ෂූන්ට ලබාදී ඇති දඬුවම්වල යම් ආකාරයක ලිහිල් බවක් දක්නට ලැබේ. මහනුවර නගරයට නුදුරු හඟුරන්කෙතදී කැප්පිටිපොළගේ සංවිධානයෙන් 1818 මැයි පස්වන දින දළදා ප්‍රදර්ශනයක් පවත්වා (විමලානන්ද, 2006 b, 138,140) රටේ පැවති සාම්ප්‍රදායික මතය අනුව දළදාව හිමි තමන්ට රටේ පාලනය හිමි බව ප්‍රකාශ කරමින් අරගලය ජයග්‍රාහී මාවතකට ගෙන ඒමට හැකි වන්නේ වාරියපොල සුමංගල හිමියන් මහනුවර මාළිගාවෙන් දළදාව පැහැරගෙන ගොස් අරගලකරුවන්ට ලබාදුන් බැවිනි. මෙය ඉංග්‍රීසි ආණ්ඩුවට ප්‍රබල බලපෑම් එල්ල කළ බව ඔවුන් හොඳාකාරව ම දැන සිටියේය. දළදාව තමන් සන්තකයේ පවතින බවට බ්‍රිතාන්‍යයන් රට පුරා ප්‍රචාරය කරන්නේද එබැවිනි. එහෙත් 1818 නොවැම්බර් මස දෙවන දින දන්ත ධාතුව සමග භික්ෂුවක් අත්අඩංගුවට ගැනීමට බ්‍රිතාන්‍යයන් සමත් විය. මේ පිළිබඳව එංගලන්තයට තොරතුරු වාර්තා කරන බ්‍රවුන්රිග් "එය නැවත ලබාගැනීම හැම පංතිවලම මිනිසුන් කෙරෙහි පැහැදිලි ලෙස බලපෑ කාරණයක් බව පෙනේ. අහම්බෙන් මෙන් එය අප අතට පත්වීම මිත්‍යා ඇදහිලි අනුගමනය කරන මේ මිනිසුන් විසින් සලකන ලද්දේ උඩරට ආණ්ඩු කිරීමට බ්‍රිතාන්‍ය ජාතිකයන්ට පැවරී ඇති දිව්‍යමය බලය ප්‍රදර්ශනය කිරීමක් හැටියට ය" (විමලානන්ද, 2006 a, 255) යනුවෙන් ලියා දැන්වීය. රාජ්‍ය පරිපාලනමය වශයෙන් මෙතරම් වටිනාකමක් සහිත වස්තුවක් පැහැරගෙන ගිය වාරියපොල හිමියන්ට හිමිවන්නේද අරගලයට උදව් කළ සාමාන්‍ය භික්ෂූන්ට හිමි වූ දඬුවමට සමාන දඬුවමකි. ඇතැම් බ්‍රිතාන්‍ය නිලධාරීන් ඍජුවම භික්ෂූන්ට දැඩි දඬුවම් ලබා දෙන ලෙස බ්‍රිතාන්‍ය පාලකයන්ගෙන් ඉල්ලා සිටි

අවස්ථා ද විය. එහෙත් බ්‍රිතාන්‍ය පාලකයන් භික්ෂූන් වහන්සේලාට දැඩි දඬුවම් නියම නොකරන ලද්දේ බ්‍රිතාන්‍යයන් කෙරෙහි තව තවත් මහජන විරෝධතාව වර්ධනය වේයැ යි සිතූ නිසා සහ භික්ෂූන්ගේ ක්‍රියාවන් අනවශ්‍ය විශේෂත්වයකට ලක්වීම වැළැක්වීමේ අරමුණින් විය යුතුය.

මෙතෙක් සාකච්ඡාවට ගැණුනේ 1817-18 සමයේ බ්‍රිතාන්‍යයන්ට විරුද්ධව ක්‍රියා කළ භික්ෂූන් වහන්සේලා පිළිබඳව පමණි. එහෙත් මෙම කාලවකවානුවේ බ්‍රිතාන්‍යයන්ට පක්ෂව කටයුතු කළ භික්ෂු ක්‍රියාකාරකම් පිළිබඳව ද තොරතුරු හමු වේ. උඩරට බ්‍රිතාන්‍ය නේවාසික නියෝජිතයා වූ ජෝන් ඩොයිලිගේ චරපුරුෂ යාන්ත්‍රණ යටතේ භික්ෂූන් සේවය කොට තිබේ. අරගලයේ රජු වූ විල්බාවේ පිළිබඳව සෙවීම සඳහා ඩොයිලි විසින් යොදවා තිබුණේ උඩුගම උන්නාන්සේ නමැති භික්ෂුවකි. (මෙම භික්ෂුව ජ්‍යෙෂ්ඨ ඇල්ලේපොළ උන්නාන්සේ ලෙසද හඳුන්වා තිබේ.) හෙතෙම සත්කෝරළයේ විල්බාවට ගොස් ව්‍යාජ රජුයැ යි උපකල්පනය කළ පුද්ගලයාගේ නිවැසියන් සොයා යමින් තොරතුරු ලබාගෙන මොණරාගල ප්‍රදේශයට ගොස් ඒ තමන් උපකල්පනය කරන අස්ගිරිය විහාරයට අයත් විල්බාවේ උන්නාන්සේම බව තහවුරු කරගෙන ඩොයිලිට දන්වා සිටියේය. අරගලයේ රජු බවට පත්ව සිටින්නේ සැබෑ රජ පරපුරකින් පැවතෙන්නෙකු නොවන බව ප්‍රචාරය කිරීම සඳහා සහ මාතලේ ප්‍රදේශයේ සටන් ඇති වීම වැළැක්වීමට බ්‍රිතාන්‍යයන් විසින් යොදවන ලදුව තම උපන් ගම වූ එම ප්‍රදේශයට ගොස් තිබේ. මාස දෙකක් පමණ එම කටයුතුවල නිරත වෙමින් සිටින අතරේ කැප්පිටිපොළට හසු වී දඹුලු විහාරයේ සිරගත කර තිබේ. දින දොළහකට පසු කැප්පිටිපොළ එම ප්‍රදේශයෙන් ඉවත්ව ගියෙන් අත්අඩංගුවෙන් මිදී නුවරට පලා ඒමට සමත්ව ඇත (විමලානන්ද, 2006 b, 08-10).

හඟුරන්කෙතදී විශාල ජන සහභාගීත්වයක් සහිතව දළදා ප්‍රදර්ශනයක් පැවැත් වූ බවට තොරතුරු ජෝන් ඩොයිලි වෙත ලබා දෙන්නේ ද භික්ෂුවක විසිනි (විමලානන්ද, 2006, 140). කන්ද උඩරට අරගලයේ තවත් අමුතු පැතිකඩක් හෙළිකරමින් බ්‍රිතාන්‍යයන්ට අවනත නොවූ පුද්ගලයන් අවනත කරගැනීම සඳහා අරක්කු ලබා දීමේ උපායක් ක්‍රියාත්මකව තිබේ. මෙහි විශේෂත්වය වන්නේ මත්පැන් ලබා දීමේ කටයුත්තට භික්ෂූන් වහන්සේලා දායක කරගෙන තිබීමයි. ඒ බව ඩොයිලි විසින් ගොඩමුනේ උන්නාන්සේ නැමැත්තෙකු, ගුණ ගරුක නිලමේවරු තමන් වෙතට නම්මවාගැනීම සඳහා මත්පැන් ලබා දීමට යොදාගෙන තිබීමෙන් පැහැදිලි වේ (විමලානන්ද, 2006 b, 230).

බ්‍රිතාන්‍යයට පක්ෂව කටයුතු කළ භික්ෂූන් වහන්සේලා පිළිබඳව අධ්‍යයනය කිරීමේ දී හමුවන තවත් භික්ෂුවකි, 1816 අක්‍රීය අරගලයට මුලින් සහයෝගය ලබාදී පසුව බ්‍රිතාන්‍යයන්ට එම අරගලයේ තොරතුරු අනාවරණය කළ කපුලියද්දේ උන්නාන්සේ. මොහු අරගලයට සම්බන්ධ වීම සම්බන්ධයෙන් අත්අඩංගුවට ගත් පළමු අවස්ථාවේ එයින් මිදී පලා ගොස් සිටියදී දෙවන වර අත්අඩංගුවට ගන්නා විට සිටියේ උපැවිදි බවට පත්වය. රොබට් බ්‍රවුන්රිග් විසින් බැතර්ස්ට් වංශාධිපතිවරයා වෙත ලියා යවන ලද ලිපියක එන "කලක් ඔහු සිරභාරයේ තැබීමෙන් පසු ඩොයිලි මහතාගේ ඉල්ලීම පිට කොළඹ නතර වී උඩරට පළාත් භාර කාර්යාලයට පැමිණ දවසකට වරක් පෙනී සිටීමට නියම කරන ලදුව දැනට නොකඩවා ඔහු එසේ කරමින් සිටී. ඔහු ඉංග්‍රීසි භාෂාව ඉගෙන ගැනීමට ආශාවක් දැක්වීය. බෞතීස්ම ලැබීමට ද කැමතියැ යි ඔහු කියා සිටියේය. තම ගමරට වෙත යාමට ඔහු බලවත් නොකැමැත්තක් දැක්වීය. එසේම ඔහු තමාගේ සේවයෙන් ප්‍රයෝජන ගත හැකි යම්කිසි කාර්යයක් පවරන මෙන් ද මහත් ඕනෑකමින් ඉල්ලයි" (විමලානන්ද, 2006, 03) මෙම සටහනින් කපුලියද්දේ නම් පුද්ගලයා කවරෙක් බවට පත්ව සිටියේදැ යි හඳුනාගත හැකිය.

මේ අනුව පැහැදිලි වන්නේ පූර්ණ වශයෙන් සියලු භික්ෂූන් වහන්සේලා කන්ද උඩරටින් බ්‍රිතාන්‍ය පාලනය එලවා දැමීම සඳහා අත්වැල් බැඳගෙන නොසිටි බවයි. පූර්වයෙන් සාකච්ඡා කරන ලද කරුණුවලින් බ්‍රිතාන්‍ය විරෝධීව විශාල භික්ෂු පිරිසක් කටයුතු කොට ඇති බව නිගමනය කළ හැකිය. එසේම කැප්පිටිපොළ, මඩුගල්ලේ සහ පිළිමතලාවේ ප්‍රමුඛ කොටගත් විශාල රදල නායකයන් පිරිසක් සමග ඌව වෙල්ලස්ස, බින්තැන්න, සත් කෝරළය, මාතලේ ආදී ප්‍රදේශවල සාමාන්‍ය ජනයා විශාල ප්‍රමාණයක් ද ජීවිත පරිත්‍යාගයෙන් යුතුව මෙම අරගලයට නායකත්වය, දායකත්වය සපයා තිබේ. එසේ වුවත් 1818 සැප්තැම්බර් මාසය වනවිට එනම් අරගලය ආරම්භ වී අවුරුද්දකට ආසන්න කාලයක් ගත වන විට එය අසාර්ථක වන ලකුණු පැහැදිලිව පෙනෙන්නට විය. සටනට තෝරාගත් රජු සම්බන්ධයෙන් නායකයන් අතර විරෝධතා මතු වීම, 1818 පෙබරවාරි 21 වන දින පනවන ලද යුධ නීතිය දැඩිව ක්‍රියාත්මක වීම, බ්‍රවුන්රිග් විසින් ඉන්දියාවෙන් ඉල්ලූ ආධාරක සේනා ලැබීම, (විමලානන්ද, 2006, 109) ප්‍රධාන අධිකාරම්වරයා වූ මොල්ලිගොඩ බ්‍රිතාන්‍ය පක්ෂය ගෙන ක්‍රියා කිරීම යන ප්‍රමුඛ සාධක අරගලය අසාර්ථක වීමට හේතු වූ බව හඳුනාගත හැකිය. අරගලය මර්දනය කළ ආකාරය ඉංග්‍රීසි ලේඛකයන් දක්වා ඇති ආකාරය, විග්‍රහ කිරීම්වලින් තොරව එය වටහා ගැනීමට හොඳම මාර්ගයයි. "1817-1818 උඩ රට පළාත්වල ඉංග්‍රීසීන් ආණ්ඩු කළ ක්‍රමය කියවන විට අපට ලජ්ජා උපදී. 1819 දී රටේ උසස් පවුල්වල කිසිවෙකු ඉතිරි නොවීය. කඩුවෙන් හෝ තුවක්කුවෙන් වරද නොලැබ ඉතිරි වූවෝ කොලරාව හා වසූරිය නිසා ද හාමත් කම නිසා ද සිය ගණනින් මරුමුවට පත් වූහ" (Lawrie Gazetter, Volum-1) බ්‍රිතාන්‍යයන් නිර්දය අයුරින් අරගලයට විසඳුම් ලබා දී ඇති ආකාරය මෙම ප්‍රකාශනවලින් මැනවින් තහවුරු වේ. එපමණක්ම නොවේ "මා සේවයෙන් මුදනු ලැබූ පසු මං පහරන පල් හොරෙකු වීමට අදහස් කරමි. කුමක් නිසා ද යත් මහනුවර සිදු වූ දෑ දැසින් දැක්කාට පසු මිනිසෙකුගේ දිවි තොර කිරීම එතරම් අසීරු කරුණක් නොවන හෙයිනි" (සිංහල විශ්වකෝෂය- සිවුවන කාණ්ඩය, 1970, 402) යනුවෙන් අරගලය මර්දනයට සම්බන්ධ වූ 19 වන රෙජිමේන්තුවේ භටයෙකු කළ මෙම ප්‍රකාශයෙනුත් උඩරට බ්‍රිතාන්‍යයන් සිදු කළ භීෂණය කෙතරම් දරුණුදැ යි හඳුනාගත හැකිය.

1818 ඔක්තෝම්බර් 28වැනි දින නුවරකලාවියේ පරවහගමදී ලෙෆ්ටිනන්ට් ඕනීල් ඇතුළු කණ්ඩායමක් විසින් කැප්පිටිපොළ සහ පිළිමතලාවේ අත්අඩංගුවට ගැනීමෙනුත් (විමලානන්ද, 2006, 246) මාතලේ ප්‍රදේශයේදී මඩුගල්ලේ නොවැම්බර් 01වැනි දින අත්අඩංගුවට ගැනීමෙනුත් (විමලානන්ද, 2006, 255) නොවැම්බර් මස 20වැනි දින කිවුලේගෙදර මොහොට්ටාල අත්අඩංගුවට ගැනීමෙනුත් (එම) අරගලයට සම්බන්ධ ප්‍රධාන පෙළේ සියලුම නායකයන් යටත් කර ගැනීමට බ්‍රිතාන්‍යයන් සමත් වූ බව පෙනේ. නොවැම්බර් මස 02 වැනි දින අහම්බෙන් මෙන් දළදාව සහිත භික්ෂුවක් අත්අඩංගුවට ගැනීමට හැකි වීම (එම), 1817 ඔක්තෝම්බර් මාසයේදී ආරම්භ වන බ්‍රිතාන්‍ය විරෝධී අරගලය 1818 නොවැම්බරයේ දී අවසානය සනිටුහන් කිරීමට මනෝ මූලිකව බලපාන ලද ප්‍රධාන අවස්ථාව ලෙස සැලකිය හැකිය.

**සමාලෝචනය**

1815 දී කිසිදු මනුෂ්‍ය ඝාතනයකින් තොරව සමස්ත ලංකා භූමියම විදෙස් ජාතියකට යටත්වීමෙන් පසුව යළි ස්වකීය ස්වාධීනතාව දිනාගැනීම උදෙසා වෙල්ලස්ස ප්‍රදේශය පදනම් කරගනිමින් ලාංකිකයා පෙළගැසෙන අයුරුත්, ඒ සඳහා බලපෑ හේතුකාරණාවනුත් මොනවාද යන්න විචාර පූර්වක ඓතිහාසික දෘෂ්ටියකින් මෙහිදී අධ්‍යයනයට ලක්කොට තිබේ. එකී අධ්‍යයනය මගින් පෙනීයන්නේ 1818 අරගලය සැලසුම්කරණය කිරීමේ දී භික්ෂුව ප්‍රමුඛ දායකත්වයක් ලබාදී ඇති බවයි.

එසේම එම සැලසුම් සාර්ථක කරගැනීම සඳහා නායකත්වය පමණක් නොව සක්‍රීය දායකත්වය ද ලබා දී ඇති බව ප්‍රකටව පෙනේ.

## ආශ්‍රිත ග්‍රන්ථ


අභයසිංහ, ටී., දේවරාජා, ශ්‍රී. ලෝනා සහ සෝමරත්න, ජී. වී. පී. (1977) *උඩරට රාජධානිය.* කොළඹ: ලේක්හවුස් ඉන්වෙස්ට්මන්ට්.

අලුවිහාරේ, බී. එච්. (1941) *උඩරට ගිවිසුම හා ඉන් පසු.* නුවර: ප්‍රකාශකයා සඳහන් නොවේ.

ඇදගම, මාලනී. (2014), *යටත් විජිතවාදයේ ව්‍යාප්තිය සහ ස්වදේශීය ප්‍රතික්‍රියා,*, විජේතුංග, ඩබ්ලිව්. එම්. කේ. (සංස්.) ශ්‍රී ලාංකේය ඉතිහාසය, වෙළුම IV. කොළඹ: ඇම්. ඩී. ගුණසේන සහ සමාගම.

රාහුල, වල්පොළ හිමි. (2012) *භික්ෂුවගේ උරුමය.* කොළඹ: එස්. ගොඩගේ සහ සහෝදරයෝ.

විමලානන්ද, තෙන්නකෝන්. (2006) *උඩරට මහ කැරැල්ල*, කාණ්ඩය 2. කොළඹ: ඇම්. ඩී. ගුණසේන සහ සමාගම.

විමලානන්ද, තෙන්නකෝන්. (2006) *උඩරට මහ කැරැල්ල*, කාණ්ඩය 3. කොළඹ: ඇම්. ඩී. ගුණසේන සහ සමාගම.

හෙට්ටිආරච්චි, ඊ. ඩී. (1970) *සිංහල විශ්ව කෝෂය* (කාණ්ඩය 4). ප්‍රකාශන ස්ථානය සඳහන් නොවේ: සංස්කෘතික දෙපාර්තමේන්තුව.

පීරිස්, පෝල් ඊ. (2002) *ත්‍රී සිංහලේ.* පරිව. සුචරිත ගමලත් සහ සේපාල විජේසේකර. කොළඹ: එස්. ගොඩගේ සහ සහෝදරයෝ.

ඩොයිලි. (1994) *ඩොයිලිගේ දිනපොත.* පරි. ධර්ම ශ්‍රී ගුණපාල. ප්‍රකාශන ස්ථානය හෝ ආයතනය සඳහන් නොවේ.

සිල්වා, කොල්වින් ආර්. ද. (1958) *බ්‍රිතාන්‍යයන් යටතේ පැවති ලංකාව.* පරිව. යූ. ඩී. ජයසේකර. කොළඹ: ඇපොතිකරීස් සමාගම.

පෙරේරා, එස්. ජී. පියතුමා. (1967) *ලංකා ඉතිහාසය.* අනු. පී. බී. ජේ. හේවාවසම්. කොළඹ: ලේක්හවුස් ඉන්වෙස්ට්මන්ට් ලිමිටඩ්.

Davy, J. (1821) *An Account of the Interior of Ceylon and its inhabitants*. London: Longmans.

Pieris, P.E. (2001) *Tri Sinhale: The Last Phase*. New Delhi: Asian Education Service.